10170

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II
Communication and Media Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. මුද්‍රණ ශිල්පය මෙරටට හඳුන්වාදෙන ලද්දේ,
(1) ලන්දේසීන් ය. (2) පෘතුගීසීන් ය.
(3) බ්‍රිතාන්‍යයන් ය. (4) චීන ජාතිකයන් ය.

2. අන්තර්පුද්ගල සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි තාක්ෂණික මෙවලම් දැක්වෙන වරණය තෝරන්න.
(1) පුවත්පත්, ෆැක්ස් යන්ත්‍රය (2) විද්‍යුත් තැපෑල, දුරකථනය
(3) ගුවන්විදුලිය, ෆැක්ස් යන්ත්‍රය (4) ජංගම දුරකථනය, රූපවාහිනිය

3. බ්‍රිතාන්‍ය යටත් විජිතයක ස්ථාපනය කරන ලද ප්‍රථම ගුවන්විදුලි සේවය නිල වශයෙන් විවෘත කරන ලද්දේ,
(1) 1920 අගෝස්තු 20 ය. (2) 1924 ජුනි 12 ය.
(3) 1925 දෙසැම්බර් 16 ය. (4) 1949 ඔක්තෝම්බර් 05 ය.

4. සමූහ සන්නිවේදනය මූලික වශයෙන් අර්ථ දැක්විය හැකි වන්නේ,
(1) එම ක්‍රියාවලියට සම්බන්ධ පුද්ගල සංඛ්‍යාව මත ය.
(2) කණ්ඩායම වාචික සන්නිවේදනයේ යෙදීම මත ය.
(3) සියලු දෙනා එකිනෙකාට සම්මුඛව සිටීම මත ය.
(4) එකවර සමූහයට සන්නිවේදනය කිරීමට හැකිවීම මත ය.

5. ලෝකයේ පළමු ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ,
(1) ලතින් ව්‍යාකරණයයි. (2) වජ්‍ර සූත්‍රයයි.
(3) ලතින් බයිබලයයි. (4) ලන්දේසි යාඥා පොතයි.

6. පුවත්පතක ප්‍රවෘත්ති පිටු සංස්කරණය කරනු ලබන්නේ,
(1) ප්‍රධාන කර්තෘ විසින් ය. (2) උප කර්තෘවරු විසින් ය.
(3) නියෝජ්‍ය කර්තෘ විසින් ය. (4) සම කර්තෘ විසින් ය.

7. අවාචික සන්නිවේදනයට අදාළ වරණය කුමක් ද?
(1) ඇඳුම් පැළඳුම්, කට හඬ, අභිනය (2) අත වැනීම, පෞද්ගලික දුර, සන්නස
(3) ගුහා චිත්‍ර, සෙල්ලිපි, බෙර හඬ (4) පුස්කොළ පොත, පෞද්ගලික දුර, සිතියම

[දෙවැනි පිටුව බලන්න.

8. පුවත්පතක පෙළ (Text) හා රූප (Image) යන්නට පිළිවෙළින් අයත් වන්නේ කුමක් ද?
   (1) අකුරු හා සිරස්තල (2) වචන හා කාටූන්
   (3) වාක්‍ය හා ඡේද (4) ඡායාරූප හා සටහන්

9. නීත්‍යානුකූල දේශසීමාවක් තුළ ජීවත්වන තැනැත්තා හඳුන්වන නාමය කුමක් ද?
   (1) සංචාරකයා (2) පුරවැසියා (3) ඡන්දදායකයා (4) බදු ගෙවන්නා

10.



ඉහත රූපසටහන මගින් නියෝජනය කෙරෙන්නේ,
   (1) තනි දාමයයි. (2) පර්ෂද දාමයයි.
   (3) සම්භාවිතා දාමයයි. (4) ඕපාදූප දාමයයි.

11. පරිගණකය ආශ්‍රිතව භාවිත කළ හැකි මුද්‍රණ යන්ත්‍ර වර්ගයක් **නොවන්නේ,**
   (1) ඡායා පිටපත් යන්ත්‍රයයි. (2) රෝනියෝ යන්ත්‍රයයි.
   (3) බබල් ජෙට් මුද්‍රණ යන්ත්‍රයයි. (4) ලේසර් මුද්‍රණ යන්ත්‍රයයි.

12. පුවත්පතක් හා සම්බන්ධ නඩු කටයුත්තක දී එහි වගකීම දරනු ලබන්නේ,
   (1) ප්‍රධාන කර්තෘ විසිනි. (2) නියෝජ්‍ය කර්තෘ විසිනි.
   (3) උප කර්තෘ විසිනි. (4) ප්‍රවෘත්ති කර්තෘ විසිනි.

13. ක්‍රිකට් ලෝක කුසලාන අවසන් මහා තරගයේ සජීවී රූපවාහිනී විකාශය පුළුල් තිර ඔස්සේ ප්‍රසිද්ධ ස්ථානවල දී ප්‍රේක්ෂකයින්ට දැකබලා ගැනීමේ අවස්ථාව උදාවිය. මීට අදාළ සන්නිවේදන වර්ගය හා ස්වරූපය වන්නේ,
   (1) සමූහ හා දෘශ්‍ය සන්නිවේදනයයි.
   (2) ජන හා දෘශ්‍ය සන්නිවේදනයයි.
   (3) ජන හා සමූහ සන්නිවේදනයයි.
   (4) දෘශ්‍ය හා අන්තර්පුද්ගල සන්නිවේදනයයි.

14. ශ්‍රී ලංකාවේ පළමු රූපවාහිනී සේවය ආරම්භ කරනු ලබන්නේ,
   (1) පෞද්ගලික හිමිකම යටතේ ය. (2) රාජ්‍ය හිමිකම යටතේ ය.
   (3) රාජ්‍ය සංස්ථාවක් ලෙසිනි. (4) රජය සතු කොටස් හිමි සමාගමක් ලෙසිනි.

15. අන්තර්ජාල පහසුකම් යොදාගනිමින් යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින් පවත්වාගෙන යනු ලබන විද්‍යුත් තොරතුරු ඇතුළත් ගොනුව,
   (1) විශ්වකෝෂයයි. (2) විද්‍යුත් තැපෑලයි.
   (3) විද්‍යුත් කැඳවනයයි. (4) වෙබ් අඩවියයි.

16. වර්තමාන ශ්‍රී ලාංකේය ගුවන්විදුලි නාලිකා සිය සම්ප්‍රේෂණ සඳහා බහුල වශයෙන් යොදාගන්නා තරංග වර්ගය වන්නේ,
   (1) කෙටි තරංග (SW) ය. (2) මධ්‍යම තරංග (MW) ය.
   (3) සංඛ්‍යාත මූර්ජන තරංග (FM) ය. (4) විස්තාර මූර්ජන තරංග (AM) ය.

17. සිංහල මාධ්‍ය පුවත්පත්වල දෙමළ හා මුස්ලිම් ප්‍රජාවට අදාළ ප්‍රවෘත්ති ප්‍රමාණවත් ලෙස පළ **නොවීම** අදාළ වන්නේ,
   (1) මානව හිමිකම්වලට ය. (2) පුරවැසිභාවයට ය.
   (3) වාර්ගිකත්වයට ය. (4) සංවර්ධනාත්මක චින්තනයට ය.

18. වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) මාධ්‍ය යනු ලාභදායී ව්‍යාපාරයකි.
   (2) මාධ්‍ය මගින් ප්‍රවෘත්ති ඉදිරිපත් කරනු ලබයි.
   (3) මාධ්‍ය කර්මාන්තය හැමවිටම තරගකාරී ය.
   (4) මාධ්‍ය යනු තොරතුරු අලෙවිය පාදක කරගත් ව්‍යාපාරයකි.

19. කිසියම් විධායක නිලධාරියෙකු තම අත්සන සමග නිල මුද්‍රාව තැබීම වඩාත් වැදගත් වන්නේ, එමගින්
(1) සුරක්ෂිතතාව ලැබෙන බැවිනි.
(2) විශ්වසනීයත්වය තහවුරු වන බැවිනි.
(3) නීත්‍යානුකූල වලංගුභාවය ලැබෙන බැවිනි.
(4) අනුමැතිය හා වගකීම තහවුරු වන බැවිනි.

20. පහත රූපසටහනෙහි දැක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියට අදාළ පියවර කිහිපයකි.

සන්නිවේදකයා ⟶ [ ] ⟶ [ ] ⟶ ග්‍රාහකයා ⟶ බලපෑම

මෙහි හිස් කොටුවලට අදාළ පියවර අනුපිළිවෙළින්,
(1) සන්දේශය හා සංඥායි.
(2) සන්දේශය හා මාධ්‍යයයි.
(3) සම්ප්‍රේෂකය හා සන්දේශයයි.
(4) සන්දේශය හා සම්ප්‍රේෂකයයි.

21. සරල වාක්‍ය රටා, නිවැරදි උච්චාරණය හා නිරවුල් භාෂාවකින් යුක්ත වීම යන ලක්ෂණ ඇතුළත් වන ප්‍රවෘත්ති ගුණාංගය වන්නේ,
(1) නිවැරදි බවයි. (2) සමතුලිත බවයි. (3) පැහැදිලි බවයි. (4) සරල බවයි.

22. පුවත්පත් ප්‍රකාශනය කිරීමට අදාළ පියවර කිහිපයක් පහත දැක්වේ.
A – ප්‍රවෘත්ති රචනය
B – භාෂා සංස්කරණය
C – ප්‍රවෘත්ති/විශේෂාංග වර්ගීකරණය
D – පිටු සැකසුම
E – සෝදුපත් කියවීම

ඉහත පියවරවල නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
(1) A, B, D, C, E ය. (2) C, A, B, E, D ය. (3) C, A, D, B, E ය. (4) C, A, E, D, B ය.

23. රාජ්‍ය මාධ්‍යයන්ගේ ප්‍රධානතම කාර්යය වන්නේ,
(1) රජයේ තීරණ ජනතාව වෙත දැනුම් දීමයි.
(2) රජය පිළිබඳ යහපත් හා හිතකර මතයක් නිර්මාණය කිරීමයි.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජනතාවගේ එකඟතාව ලබා ගැනීමයි.
(4) රජය මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන කාර්යයන් සවිබල ගැන්වීමයි.

24. දෘෂ්ටියේ අඛණ්ඩතාව පිළිබඳ සිද්ධාන්තය,
(1) ඇස සහ චලනය වන වස්තුව අතර පරතරය මත රඳා පවතී.
(2) චලනය වන වස්තුවක් දෙස එක එල්ලේ බලා සිටීම නිසා උද්ගත වන්නකි.
(3) වස්තුවක චලන වේගය සහ එය දැකීමට අවශ්‍ය ආලෝක ප්‍රමාණය මත තීරණය වේ.
(4) වේගයෙන් චලනය වන වස්තුවක පිහිටීම් අතර පරතරය නොපෙනීම හේතුවෙන් ඇති වන්නකි.

25. ගුවන්විදුලි මාධ්‍යයේ දී එක් විෂයයක් හෝ විෂය කරුණක් පිළිබඳව විවිධ වූ දෘෂ්ටිකෝණවලින් බලා සකස් කෙරෙන්නේ,
(1) සඟරාමය වැඩසටහන් ය. (2) විචිත්‍රාංග වැඩසටහන් ය.
(3) ප්‍රවෘත්ති වැඩසටහන් ය. (4) සාකච්ඡා වැඩසටහන් ය.

26. 'ග්‍රාහකයින් නොමැතිව මාධ්‍යයට පැවැත්මක් නොමැත.' මෙම ප්‍රකාශය මගින් අදහස් කරනුයේ,
(1) මාධ්‍ය පවත්වාගෙන යනු ලබන්නේ ග්‍රාහකයින් වෙනුවෙන් වන බවයි.
(2) ග්‍රාහකයා, මාධ්‍යයේ අන්තර්ගතය තීරණය කරනු ලබන බවයි.
(3) මාධ්‍යයට ග්‍රාහකයාගේ පාරිභෝගික වටිනාකම අදාළ නොවන බවයි.
(4) ග්‍රාහකයන් මාධ්‍යයට වුවමනා පරිදි කටයුතු කරනු ලබන බවයි.

27. යටිකුරු පිරමිඩාකාර වාර්තාකරණයේ දී තොරතුරු ඉදිරිපත් කරන්නේ ඒවායේ,
(1) වැදගත්කම ඉස්මතු වන ආකාරයට ය.
(2) වැදගත්කම යටපත් වන ආකාරයට ය.
(3) වැදගත්කම අඩු වී යන ආකාරයට ය.
(4) වැදගත්කම වැඩි වී යන ආකාරයට ය.

28. රූපවාහිනි රියැලිටි වැඩසටහනක ප්‍රධානතම ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) විශාල වේදිකා පසුතල යොදා ගැනීමයි.
(2) ග්‍රාහක ප්‍රතිචාර සඳහා අවස්ථාවක් සලසා දීමයි.
(3) පිටපත් සැකසීමෙන් හා සංස්කරණයෙන් තොර වීමයි.
(4) කිහිපදෙනෙක්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් සිටීමයි.

29. ශ්‍රව්‍ය ප්‍රකාශන විධි ඇතුළත් වරණය තෝරන්න.
(1) හඬ, නිහඬ බව, සංගීතය හා ශබ්ද
(2) සංගීතය, සංඥා, සංකේත හා හඬ
(3) සංඥා, සංගීතය, නිහඬ බව හා ශබ්ද
(4) සංකේත, නිහඬ බව, සංගීතය හා හඬ

30. මෙම රූපයේ දැක්වෙන්නේ,

(1) රූප සංරචනයයි (composition).
(2) ස්වර්ණමය රීතියයි (the golden rule).
(3) නාභිගත කිරීමයි (focusing).
(4) විභේදන බලයයි (resolution).

31. තොරතුරක් සන්නිවේදනය කිරීමේ දී යම් පුද්ගලයෙකුට තිබිය යුතු ප්‍රධාන හැකියා දෙක දැක්වෙන වරණය කුමක් ද?
(1) නිර්මාණාත්මක හැකියාව, කථන හැකියාව
(2) සන්නිවේදන හැකියාව, ලේඛන හැකියාව
(3) භාෂා හැකියාව, සන්නිවේදන හැකියාව
(4) භාෂා හැකියාව, නිර්මාණාත්මක හැකියාව

32. කිසියම් ආයතනයක වාර්ෂික වාර්තාවේ පිටපත් 50 ක් කඩිනමින් සහ පහසුවෙන් මුද්‍රණය කර ගැනීමට අවශ්‍ය විය. මේ සඳහා වඩාත් යෝග්‍ය විධික්‍රමය වන්නේ,
(1) රෝනියෝ කිරීමයි.
(2) ඩිජිටල් අනුපිටපත්කරණයයි.
(3) ඡායා පිටපත්කරණයයි.
(4) පරිගණක ආශ්‍රිත මුද්‍රණයයි.

33. දෘශ්‍ය සංඥා විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රතිනිර්මාණය කිරීමට දැරූ උත්සහයේ ප්‍රතිඵලය ලෙස,
(1) කැමරාව බිහි විය.
(2) සිනමා මාධ්‍යය බිහි විය.
(3) රූපවාහිනී මාධ්‍යය බිහි විය.
(4) පරිගණකය බිහි විය.

34. පහත ප්‍රකාශ සලකා බලන්න.
A – සේයා පටල භාවිතය අවශ්‍ය නොවීම
B – රසායනික මාධ්‍යයක් මගින් ඡායාරූප සටහන් කරගනු ලැබීම
C – පරිගණක මෘදුකාංග යොදාගෙන පහසුවෙන් ඡායාරූප සංස්කරණය කරගත හැකිවීම
D – සටහන් කරගන්නා ප්‍රතිබිම්බය විද්‍යුත් සංඥාවක් බවට පත් කර දත්ත ගොනුවක් ලෙස ගබඩා කරගැනීම

මේවායින් ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

35. සාම්ප්‍රදායික සන්නිවේදන භාවිතයන් ඇතුළත් **නොවන** වරණය වන්නේ,
(1) බුලත් දීම, විරිඳු, රූකඩ හා බෙරහඬ ය.
(2) ගිනිමැලය, රූකඩ, කවි කොළය හා සොකරි ය.
(3) කොළ අතු එල්ලීම, ජනකතා, ගිනිමැලය හා හූව ය.
(4) කෙම් ක්‍රම, කවි කොළය, පෝස්ටරය හා තුහංවි කවි ය.

36. පරිගණකයක් භාවිත කරමින් තොරතුරු ඉදිරිපත් කිරීම සිදුකළ හැකි වන්නේ,
(1) අන්තර් ක්‍රියාකාරී පුවරුවක් සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මගිනි.
(2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මගිනි.
(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සහ අන්තර් ක්‍රියාකාරී පුවරුවක් මගිනි.
(4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සහ ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මගිනි.

37. සිනමා සම්මාන උළෙලක් අවසානයේ හොඳම නිළිය ලෙස සම්මානයට පාත්‍ර වූ රංගන ශිල්පිනිය වටා රැස් වූ පිරිසක් දැක්වූ අදහස් පහත දැක්වේ.
A - "ඔබේ රඟපෑම අති විශිෂ්ටයි."
B - "ඔබ චරිත තෝරා බේරාගෙන රඟපාන බව පේනවා."
C - "මට තාම ඔබ රඟපෑ මෑත කාලීන චිත්‍රපටයක් නරඹන්නට බැරි වුණා."
මෙම එක් එක් ප්‍රකාශවලට වඩාත් ගැළපෙන ග්‍රාහක වර්ගය පිළිවෙළින්,
(1) සක්‍රිය ග්‍රාහකයෙක්, නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් හා නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් ය.
(2) සක්‍රිය ග්‍රාහකයෙක්, සක්‍රිය ග්‍රාහකයෙක් හා නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් ය.
(3) නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක්, නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් හා සක්‍රිය ග්‍රාහකයෙක් ය.
(4) නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක්, සක්‍රිය ග්‍රාහකයෙක් හා නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් ය.

38. අන්තර්ජාලයේ පළකරන පුවත්පත් අයත් වන්නේ,
(1) සාම්ප්‍රදායික මාධ්‍යයට ය. (2) නූතන මාධ්‍යයට ය.
(3) ජන මාධ්‍යයට ය. (4) නව මාධ්‍යයට ය.

39. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) මගින් තහවුරු කර ඇති පුරවැසි හිමිකම කුමක් ද?
(1) තොරතුරු ලැබීමට හා දීමට ඇති අයිතිය.
(2) මතයක් දැරීමට හා ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.
(3) භාෂණයේ, ප්‍රකාශනයේ සහ අදහස් පළ කිරීමේ නිදහස.
(4) තොරතුරු ඒකරාශීකරණයට, දීමට හා ලැබීමට ඇති හිමිකම.

40. එක්තරා චොකලට් වර්ගයක් මිල දී ගැනීමේ දී ආකර්ෂණීය අත් පළඳනාවක් නොමිලේ ලබාදෙන බව රූපවාහිනී වෙළෙඳ දැන්වීමක ඇතුළත් විය. එය දුටු වමිත් එම චොකලට් වර්ගය මිල දී ගෙන දෙන ලෙස මවට ඇවිටිලි කළේ අත් පළඳනාව ලබා ගැනීමේ අටියෙනි. මෙම සිදුවීමට අදාළ සන්නිවේදන ස්වරූපය හා කාර්යය දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(1) දෘශ්‍ය-පෙළඹවීම (2) ශ්‍රව්‍ය-තොරතුරු සැපයීම
(3) වාචික-සමාජානුයෝජනය (4) අවාචික-විනෝදාස්වාදය

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

87 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II
Communication and Media Studies I, II

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

1. දුරකථනය සොයා ගැනීමෙන් පසුව සිදු වූ තාක්ෂණික දියුණුව සන්නිවේදන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කළේ ය.

(i) දුරකථනය සොයාගනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ii) ආරම්භක අවදියේ දී දුරකථනය කවර සන්නිවේදන වර්ගයක් සඳහා භාවිත කළේ ද?

(iii) වීඩියෝ දුරකථන ඇමතුමක දී ග්‍රාහකයාගේ රූපය දැකිය හැකි ය. එහි දී භාවිත කළ හැකි අවාචික සන්නිවේදන විධික්‍රම **දෙකක්** නම් කරන්න.

(iv) දුරකථනය මගින් සම්මන්ත්‍රණ ඇමතුමක් (conference call) ලබා ගන්නා අවස්ථාවක දී භාවිත කෙරෙන සන්නිවේදන වර්ගය කුමක් ද?

(v) දුරකථනය භාවිත කළ **නොහැකි** ප්‍රධාන සන්නිවේදන වර්ගය කුමක් ද?

(vi) ජංගම දුරකථනයක් භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම **දෙකක්** සඳහන් කරන්න.

(vii) සුහුරු ජංගම දුරකථනයක් මගින් අන්තර්ජාලයට පිවිසීමට ඔබට පුළුවන. මාර්ගගතව ඔබට ප්‍රවේශ විය හැකි සමාජ මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

(viii) අන්තර්ජාල පහසුකම් සහිත සුහුරු ජංගම දුරකථනයක් මගින් විද්‍යුත් තැපැල් (email) පහසුකම ඔබට ලබා ගත හැකිය. තවත් පාර්ශ්වයක් වෙත විද්‍යුත් තැපැල් පණිවිඩයක් යැවීමේ දී ඔබ දැනගත යුතු එකී පාර්ශ්වය සතු ප්‍රධාන සාධකය කුමක් ද?

(ix) අන්තර්ජාලයෙහි ඇති විවිධාකාර වූ තොරතුරු සෙවීම සඳහා භාවිත කළ හැකි සෙවුම් යන්ත්‍රයක් (search engine) නම් කරන්න.

(x) අන්තර්ජාලයට පිවිසෙන්නෙකු හට අභිසාරී මාධ්‍ය පරිසරයක අත්දැකීම ලැබිය හැකිය. මාධ්‍ය අභිසාරිතාව යනු කුමක් ද?

2. (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් පළමු දෙමළ පුවත්පත කුමක් ද?

(ii) ප්‍රමාණය අනුව ප්‍රධාන පුවත්පත් වර්ග **දෙකක්** නම් කරන්න.

(iii) විවිධ කාර්යයන් සඳහා ඡායාරූප භාවිත කෙරේ. පහත ඡායාරූප වර්ග කෙටියෙන් විස්තර කරන්න.

(අ) වාර්තාකරණ ඡායාරූප
(ආ) ප්‍රවෘත්ති ඡායාරූප
(ඉ) නිර්මාණාත්මක ඡායාරූප

(iv) පුවත්පත් ආයතන හා සම්බන්ධ පහත මාධ්‍ය ශ්‍රමිකයන්ගේ කාර්යභාරය පිළිබඳව වෙන වෙනම සාකච්ඡා කරන්න.

(අ) මාණ්ඩලික වාර්තාකරුවන්
(ආ) ප්‍රාදේශීය වාර්තාකරුවන්

[හත්වැනි පිටුව බලන්න.

3. (i) එදිනෙදා සන්නිවේදනයේ දී භාවිත කෙරෙන ශාරීරික සාධක **දෙකක්** නම් කරන්න.

(ii) සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ නිර්වචනය ලියන්න.

(iii) කාර්යාලයීය සන්නිවේදන මෙවලමක් ලෙස තැපැල් මුද්‍රා යන්ත්‍රය පරිහරණය කිරීම හා සම්බන්ධ කරුණු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) පුවත්පත් ආයතනයක දක්නට ලැබෙන පහත එක් එක් අංශවල ක්‍රියාකාරිත්වයට අදාළ කරුණු **දෙක** බැගින් විස්තර කරන්න.

(අ) ප්‍රවෘත්ති අංශය (news section)

(ආ) විශේෂාංග අංශය (feature section)

4. (i) ආසියාවේ ප්‍රථම ගුවන්විදුලි සේවාව ආරම්භ කළ රට කුමක් ද?

(ii) හිමිකම සම්බන්ධයෙන් රාජ්‍ය දායකත්වය සහිත දේශීය ගුවන්විදුලි ආයතන **දෙකක්** නම් කරන්න.

(iii) ගුවන්විදුලි මාධ්‍යය පරිහරණය මගින් ළමුන්ට ලබා ගත හැකි ඉගෙනුම් අවකාශ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ගුවන්විදුලි ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී පෝල් ඩී. මැසනියර් විසින් ඉදිරිපත් කරන ලද සාධක **හතරෙහි** වැදගත්කම ලුවන වෙනම පැහැදිලි කරන්න.

5. ජනමාධ්‍ය මගින් නිර්මාණාත්මක සන්දේශ ග්‍රාහකයා වෙත ලබාදීමේ දී ආචාරධර්ම පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

(i) නිර්මාණයක දැකිය හැකි ගුණාංග **දෙකක්** ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය භාවිතයට අදාළ ආචාර ධර්ම පද්ධති **දෙකක්** නම් කරන්න.

(iii) රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) 'රූපවාහිනී මාධ්‍යය හා ග්‍රාහකයා අතර අන්‍යෝන්‍ය බලපෑම' පිළිබඳ පහත කරුණු යටතේ පාසල් බිත්ති පුවත්පතට ලිපියක් සම්පාදනය කරන්න.

(අ) රූපවාහිනිය ග්‍රාහක චර්යාව වෙනස් කරයි.

(ආ) රූපවාහිනිය දෛනික න්‍යාය පත්‍රය සකසයි.

6. ටෙලිනාට්‍ය මුහුරත් උළෙලක නළු නිළියන් හඳුන්වාදෙන මොහොත සිත්ගන්නා සුළු විය.

(i) ටෙලිනාට්‍යයේ ප්‍රධාන නිළිය ප්‍රධාන නළුවාට වඩා අඩුරු සමක් ඇති යුවතියක් වීම කාගේත් කතාබහට ලක් විය. මෙය කවර සංකල්පයක් යටතේ විග්‍රහ කළ හැකි ද?

(ii) ඉහත අවස්ථාවට අදාළව ලබාගත් ඡායාරූප ප්‍රවෘත්තිමය වටිනාකමින් හීන විය. එසේ වීමට හේතු **දෙකක්** දක්වන්න.

(iii) ටෙලිනාට්‍යයක දී නිශ්චල ඡායාරූප භාවිතයට ගන්නා අවස්ථා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) 'රාජ්‍ය රූපවාහිනී මාධ්‍ය ආයතන හා රජය අතර සම්බන්ධය' පිළිබඳව පහත කරුණු යටතේ රචනාවක් සම්පාදනය කරන්න.

(අ) රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීම

(ආ) මහජන මතය රජය කෙරෙහි හිතකරව පවත්වාගෙන යාම

7. මාධ්‍ය විචාරයේ දී සන්දේශය හුදකලා කොට සැලකීම සාධාරණ නොවේ.

(i) සන්දේශයකින් ඉදිරිපත් වන අදහස කුමක් ද යන්න තීරණය කිරීමට බලපාන සාධකයක් නම් කරන්න.

(ii) විචාරශීලී ග්‍රාහකයකු සතු විය යුතු නිපුණතා **දෙකක්** දක්වන්න.

(iii) ගුවන්විදුලි මාධ්‍යය සඳහා පිටපත් රචනයේ දී සපුරාලිය යුතු කොන්දේසි **තුනක්** විස්තර කරන්න.

(iv) 'අවබෝධයෙන් යුතුව සමාජ මාධ්‍ය පරිශීලනය කරමු' යන මැයෙන් කරුණු **හතරක්** යටතේ පාසල් උදෑසන රැස්වීමේ දී සිදු කරන කතාවකට අදාළ පිටපතක් සකස් කරන්න.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය

පළමු ප්‍රශ්න පත්‍රයට ලකුණු 1 x 40	-	40
දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා	-	60
මුළු ලකුණු	-	100

II වන පත්‍රය

1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10	-	20
2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරා ගත් ප්‍රශ්න 4 ලකුණු 10 බැගින්	-	40
		60

කොටස් ලකුණු බෙදීම

2 - 7 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

I	කොටසට	-	ලකුණු 1
II	කොටසට	-	ලකුණු 2
III	කොටසට	-	ලකුණු 3
IV	කොටසට	-	ලකුණු 4
			10

I - ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

බහුවරණ ප්‍රශ්ණ පත්‍රයේ ඇති සියලුම ප්‍රශ්න දැනුම උරගා බැලීමක් සහ දිනපතා ජීවිතයට අදාළ කර ගැනීමේ හැකියාව තහවුරු කිරීමත් අපේක්ෂිත ය. ඒ සඳහා 10 සහ 11 ශ්‍රේණි පොත් නිසියාකාරව පාඩම් තිබීම වැදගත් ය. වරණ අතුරින් ඉතා ම සුදුසු වරණය තේරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවනට හැකි වීම මෙහිදී බලාපොරොත්තු වේ.

මෙම පත්‍රයේ එක් ප්‍රශ්නයකට එක ලකුණ බැගින් හිමි වේ. I වන පත්‍රයට හිමිවන මුළු ලකුණු ගණන 40 කි.

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023(2024)

උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) .... √ △ $\frac{4}{5}$

(ii) .... √ △ $\frac{3}{5}$

(iii) .... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත්**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

> **සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**
>
> **(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

I පත්‍රය

ආවරණය කරනු ලබන ඉගෙනුම් ඵල

1. මුද්‍රණ ශිල්පය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදනය පිළිබඳ අවබෝධය පරීක්ෂා කරයි.
3. දේශීය ගුවන් විදුලි ඉතිහාසය පිළිබඳ ආවර්ජනය කරයි.
4. සමූහ සන්නිවේදනය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
5. මුද්‍රිත ඉතිහාසය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
6. පුවත්පත් සංස්කරණය පිළිබඳ භාවිත ස්වරූපය ගෙන හැර දක්වයි.
7. අවාචික සන්නිවේදනය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
8. පුවත්පතක මාධ්‍යමය භාවිතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
9. නීත්‍යානුකූල දේශ සීමාවක් තුළ ජීවත් වන පුද්ගලයින් පිළිබඳ දැනුම ගෙන හැර දක්වයි.
10. තොරතුරු දාම පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
11. පරිගණකය ආශ්‍රිත මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ අවබෝධය ගෙන හැර දක්වයි.
12. පුවත්පත් සම්බන්ධ නඩු කටයුත්තක දී වගකීම පිළිබඳ භාවිතය පෙන්නුම් කරයි.
13. සන්නිවේදන වර්ග හා ස්වරූප පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
14. දේශීය රූපවාහිනී ඉතිහාසය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
15. අන්තර්ජාල පහසුකම් පිළිබඳ භාවිතය විග්‍රහ කරයි.
16. ගුවන්විදුලි නාලිකාවල තරංග සම්ප්‍රේෂණය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
17. පුවෘත්ති හා වාර්ගිකත්වය පිළිබඳ විවිධතා අවබෝධයට ලක් කරයි.
18. මාධ්‍ය භාවිතය පිළිබඳව ඇති භාවිතය විමසයි.
19. අත්සන හා නිලමුද්‍රාව භාවිතය විමර්ශනය කරයි.
20. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
21. ප්‍රවෘත්තියක ගුණාංග පිළිබඳව ඇගයීමට ලක් කරයි.
22. පුවත් පත් ප්‍රකාශනයේ පියවර පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
23. රාජ්‍ය මාධ්‍ය භාවිතය පැහැදිලි කරයි.
24. දෘෂ්ටියේ අඛණ්ඩතා සිද්ධාන්තය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
25. ගුවන් විදුලි මාධ්‍ය වැඩසටහන් පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
26. මාධ්‍ය හා ග්‍රාහකයා අතර සම්බන්ධය ඇගයීමට ලක්කරයි.
27. යටිකුරු පිරමීඩාකාර වාර්තාකරණය පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
28. රූපවාහිනී රියැලිටි වැඩසටහනක භාවිත ලක්ෂණ පැහැදිලි කරයි.
29. ශ්‍රව්‍ය ප්‍රකාශන විධි භාවිතය ගෙන හැර දක්වයි.
30. ඡායාරූපකරණය පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
31. තොරතුරු සන්නිවේදනයකට පුද්ගලයකු සතු අවබෝධය ගෙන හැර දක්වයි.
32. මුද්‍රණ ක්‍රමවල භාවිතය ගෙන හැර දක්වයි.
33. දෘශ්‍ය සංඥා විද්‍යුත් ක්‍රමවේදය ඔස්සේ ප්‍රතිනිර්මාණය පිළිබඳ භාවිතය හඳුනා ගනී.
34. ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ භාවිත ස්වභාවය හඳුනා ගනී.
35. සාම්ප්‍රදායික සන්නිවේදනයේ භාවිතය පිළිබඳ ප්‍රකට කරයි.
36. පරිගණකයක් භාවිතයෙන් තොරතුරු ඉදිරිපත් කරන යන්ත්‍ර පිළිබඳ භාවිත දැනුම දක්වයි.
37. ග්‍රාහකයින්ගේ ස්වභාවය පිළිබඳ ඇගයීමක් ලබාදෙයි.
38. අන්තර්ජාලයේ පලකරන පුවත්පත් අයත් මාධ්‍ය පිළිබඳ භාවිතය ඇගයීමක යෙදේ.
39. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පුරවැසි හිමිකම පිළිබඳ භාවිතය පිළිබඳ ඇගයීමක යෙදෙයි.
40. සන්නිවේදන ස්වරූපය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය ගෙන හැර දක්වයි.

රහස්‍යයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை – 2023 (2024)

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: 87

විෂයය / பாடம்: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරෙහි අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරෙහි අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරෙහි අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරෙහි අංකය / விடை இல.
01.	1	11.	2	21.	3	31.	3
02.	2	12.	1	22.	2	32.	4
03.	3	13.	2	23.	2	33.	3
04.	1	14.	1	24.	4	34.	3
05.	2	15.	4	25.	2	35.	4
06.	2	16.	3	26.	1	36.	1
07.	1	17.	3	27.	3	37.	2
08.	2	18.	4	28.	3	38.	4
09.	2	19.	4/3	29.	1	39.	3
10.	4	20.	2	30.	2	40.	1

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: **25 / 40**

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: **25 / 40**

ලකුණු දීමේ උපදෙස්

I වන අනිවාර්ය ප්‍රශ්නයට කොටස් 10 ක් ඇතුළත් ය. එක් කොටසකට ලකුණු 02 බැගින් පිරිනැමේ.

සෙසු තෝරාගත් ප්‍රශ්නවලට ලකුණු පිරිනැමිය යුත්තේ

I කොටසට	-	ලකුණු 1
II කොටසට	-	ලකුණු 2
III කොටසට	-	ලකුණු 3
IV කොටසට	-	ලකුණු 4
		10

තෝරාගත් ප්‍රශ්න 04 ට   10 x 4 = 40

II වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

II පත්‍රය

1. දුරකථනය සොයා ගැනීමෙන් පසුව සිදු වූ තාක්ෂණික දියුණුව සන්නිවේදන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කළේ ය.

(i) දුරකථනය සොයාගනු ලැබුවේ කවුරුන් විසින් ද?

ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්

(ii) ආරම්භක අවදියේ දී දුරකථනය කවර සන්නිවේදන වර්ගයක් සඳහා භාවිත කළේ ද?

අන්තර් පුද්ගල සන්නිවේදනය/ පුද්ගලාන්තර සන්නිවේදනය

(iii) වීඩියෝ දුරකථන ඇමතුමක දී ග්‍රාහකයාගේ රූපය දැකිය හැකි ය. එහි දී භාවිත කළ හැකි අවාචික සන්නිවේදන විධික්‍රම දෙකක් නම් කරන්න.

- ශාරීරික ඉඟි හා ඉරියව්
- මුහුණේ ඉඟි හා ඉරියව්
- අක්ෂි සම්බන්ධතාව
- පාරභාෂා උපක්‍රම (හඬ උච්චාරණය, නිහඬ බව, වේගය, තීව්‍රතාව, හඬෙහි උස්පහත් බව, රිද්මය)
- ඇඳුම් හා පැළඳුම්
- ස්පර්ශය

(iv) දුරකථනය මගින් සම්මන්ත්‍රණ ඇමතුමක් (conference call) ලබා ගන්නා අවස්ථාවක දී භාවිත කෙරෙන සන්නිවේදන වර්ගය කුමක් ද?

සමූහ සන්නිවේදනය/ කණ්ඩායම් සන්නිවේදනය

(v) දුරකථනය භාවිත කළ නොහැකි ප්‍රධාන සන්නිවේදන වර්ගය කුමක් ද?

අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය

(vi) ජංගම දුරකථනයක් භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම දෙකක් සඳහන් කරන්න.

- දුරකථන ඇමතුම සක්‍රිය වූ විගස තමන්ගේ අනන්‍යතාව හෙළි කළ යුතුය.
- දෙපාර්ශවයේම ගෞරවය රැකෙන පරිදි වචන භාවිත කළ යුතුය.
- කිව යුතු දේ කෙටියෙන් ප්‍රකාශ කිරීම.
- දුරකථනයෙන් විසඳා ගත නොහැකි ප්‍රශ්න නොඇසීම.
- තමන් නොදන්නා අතහැරුණු ඇමතුම්වලට (Missed Calls) ආපසු ඇමතීමෙන් වැළකීම.
- තමන් නොදන්නා අයගේ කෙටි පණිවිඩවලට පිළිතුරු දීමෙන් වැළකීම.
- දුරකථනය තමන්ගේ පෞද්ගලික ජීවිතයට බාධාවක් කර නොගන්න.
- දුරකථන භාවිතය මුදල් බව අමතක නොකරන්න.
- අන් අය රැවටීම සඳහා භාවිත නොකිරීම.
- අන් අයගේ කාර්යය බහුල, නිදන හෝ විවේක ගන්නා අවස්ථාවලදී ඔවුන්ට බාධා වන පරිදි භාවිත නොකිරීම.
- අන් අයට බාධා වන අයුරින් ශබ්ද නගා ජංගම දුරකථනයෙන් කථා නොකිරීම.
- සිනමා ශාලා, පුස්තකාල, රැස්වීම් වැනි පොදු ස්ථානවලදී ජංගම දුරකථනය ක්‍රියාවිරහිත කර හෝ නිශ්ශබ්ද කර තැබීම.

(vii) සුහුරු ජංගම දුරකථනයක් මගින් අන්තර්ජාලයට පිවිසීමට ඔබට පුළුවන. මාර්ගගතව ඔබට ප්‍රවේශ විය හැකි සමාජ මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

- Face book
- LinkedIn
- Instagram
- Youtube
- X
- Tiktok
- Telegram
- Snapchat
- Whatsapp
- WeChat

(වෙනත් සමාජ මාධ්‍ය සපයා ඇත්නම් පරීක්ෂා කර ලකුණු ප්‍රදානය කරන්න.)

(viii) අන්තර්ජාල පහසුකම් සහිත සුහුරු ජංගම දුරකථනයක් මගින් විද්‍යුත් තැපැල් (email) පහසුකම ඔබට ලබා ගත හැකිය. තවත් පාර්ශ්වයක් වෙත විද්‍යුත් තැපැල් පණිවිඩයක් යැවීමේ දී ඔබ දැනගත යුතු එකී පාර්ශ්වය සතු ප්‍රධාන සාධකය කුමක් ද?

විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail Address)

(ix) අන්තර්ජාලයෙහි ඇති විවිධාකාර වූ තොරතුරු සෙවීම සඳහා භාවිත කළ හැකි සෙවුම් යන්ත්‍රයක් (search engine) නම් කරන්න.

- Google
- Yahoo
- ASK.com
- FireFox
- Baidu
- Safari
- Bing
- Altavista

(x) අන්තර්ජාලයට පිවිසෙන්නෙකු හට අභිසාරී මාධ්‍ය පරිසරයක අත්දැකීම ලැබිය හැකිය. මාධ්‍ය අභිසාරිතාව යනු කුමක් ද?

අන්තර්ජාලය මත සියලු මාධ්‍ය එකට හමු වීමට ඇති හැකියාව

(ලකුණු 2 x 10 = 20 යි)

2. (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් පළමු දෙමළ පුවත්පත කුමක් ද?

උදය තාරකෙ (ලකුණු 01යි)

(ii) ප්‍රමාණය අනුව ප්‍රධාන පුවත්පත් වර්ග දෙකක් නම් කරන්න.

ටැබ්ලොයිඩ් (Tabloid) හා බ්‍රෝඩ්ෂීට් (Broadsheet) (ලකුණු 02යි)

බර්ලිනර් (Berliner), කොම්පැක්ට් (Compact), ක්‍රවුන් (Crown)

(iii) විවිධ කාර්යයන් සඳහා ඡායාරූප භාවිත කෙරේ. පහත ඡායාරූප වර්ග කෙටියෙන් විස්තර කරන්න.

(අ) වාර්තාකරණ ඡායාරූප
(ආ) ප්‍රවෘත්ති ඡායාරූප
(ඉ) නිර්මාණාත්මක ඡායාරූප

වාර්තාකරණ ඡායාරූප

- භෞතික වස්තූන් ඒ අයුරින් ම ප්‍රතිරූපනය කළ යුතු ය.
- ඡායාරූපය පාඨකයාට තේරුම් ගැනීමට තරම් පැහැදිලි තොරතුරු එහි අඩංගු විය යුතු ය.
- යම් සිදුවීමකට අදාළ ඡායාරූපයක් ලබා දිය යුතුය.
  නිශ්චිත සිද්ධි වාර්තා කිරීමේදී ඊට අදාළ තේමාව මනා සේ විදහා දැක්වෙන අයුරින් ඡායාරූප ගත යුතුය.

ප්‍රවෘත්ති ඡායාරූප

- ප්‍රවෘත්ති ඡායාරූපයකට විෂය වන්නේ ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුතු සිදු වීමකි.
- ප්‍රවෘත්ති ඡායාරූපයක් සඳහා ප්‍රවෘත්තිමය ගුණාංග තිබිය යුතුය. (කාලෝචිත බව, කැපී පෙනීම, බලපෑම, සමීපතාව, මානව ඇල්ම, අසාමාන්‍ය බව, නැවුම් බව, ගැටුම්කාරී බව, අදාළ බව)

නිර්මාණාත්මක ඡායාරූප

- වක්‍ර අදහස් ඉදිරිපත් කිරීම නිර්මාණාත්මක ඡායාරූපකරණයේ ලක්ෂණයකි.
- අපූර්ව නිර්මාණ හැකියාවත් පෞද්ගලික දෘෂ්ටි කෝණයත් එක්ව නිර්මාණාත්මක ඡායාරූපයක් බිහි වේ.
- සෞන්දර්යාත්මක ගොඩනැගීම් පිළිබඳ අත්දැකීම් රැසක් මත ඡායාරූපය බිහි වේ.

පහත සඳහන් ලක්ෂණ සියලු ඡායාරූප වර්ග සඳහා අදාළ වේ.

- අදාළ සියලු විස්තර ඇතුළත්ව තිබීම
- අනවශ්‍ය දෑ ඇතුළත්ව නොතිබීම
- රාමුව තුළ ඡායාරූපික වස්තූන් මනාව සංවිධානය කර තිබීම
- උචිත කැමරා කෝණය
- නිවැරදි ආලෝකය
- නිවැරදි අනාවරණය
- ඡායාරූපය සටහන් කර ගන්නා නිසි මොහොත

(ලකුණු 03යි)

(iv) පුවත්පත් ආයතන හා සම්බන්ධ පහත මාධ්‍ය ශ්‍රමිකයන්ගේ කාර්යභාරය පිළිබඳව වෙන වෙනම සාකච්ඡා කරන්න.

(අ) මාණ්ඩලික වාර්තාකරුවන්
(ආ) ප්‍රාදේශීය වාර්තාකරුවන්

මාණ්ඩලික වාර්තාකරුවන්

- වෘත්තීය මාධ්‍යවේදීන් ලෙස ද හැඳින්වේ.
- ජනමාධ්‍ය ආයතනවල මාසික වැටුප් ලබන මාධ්‍ය ශ්‍රමිකයන් ය.
- ආයතනය තුළ හෝ ආයතන විසින් යොදවන මාධ්‍ය කාර්යය ඉටු කිරීමට බැඳී සිටීම
- වැටුපට අමතරව වෙනත් සේවා පහසුකම් වරප්‍රසාද උසස්වීම් හිමි වීම

ප්‍රාදේශිය මාධ්‍යවේදීන්

- අර්ධකාලීන වශයෙන් යම් ජනමාධ්‍ය ආයතනයකට සේවාව සපයයි.
- මාධ්‍ය ආයතන සමග ගිවිසුම්ගතව බැඳි සිටීම.
- තම සේවාව වෙනුවෙන් පමණක් බැඳී සිටීම.
- වෙනත් රැකියාවක් කරන අතරතුර හෝ විශ්‍රාම ගතවීමෙන් පසුව හෝ මාධ්‍ය ශ්‍රමිකයන් ලෙස කටයුතු කරයි.
- සපයන ලද තොරතුරු අනුව ගෙවීම් කරනු ලැබේ.
- බොහෝවිට නිශ්චිත භූගෝලීය සීමාවකට අදාළව තම සේවාව සපයනු ලබයි.

(ලකුණු 04යි)

3. (i) එදිනෙදා සන්නිවේදනයේ දී භාවිත කෙරෙන ශාරීරික සාධක **දෙකක්** නම් කරන්න.

- ශාරීරික ඉඟි හා ඉරියව්
- මුහුණේ ඉඟි හා ඉරියව්
- අක්ෂි සම්බන්ධතාව
- ස්පර්ශය
- ගන්ධය

(ලකුණු 01යි)

(ii) සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ නිර්වචනය ලියන්න.

"කිසියම් කෙනෙක්, යම් කිසිවක් කිසියම් නාලියකින්, යම් කෙනෙකුට, යම් බලපෑමක් සඳහා, ඉදිරිපත් කරන දෙය සන්නිවේදනයයි."

(ලකුණු 02යි)

(iii) කාර්යාලයීය සන්නිවේදන මෙවලමක් ලෙස තැපැල් මුද්‍රා යන්ත්‍රය පරිහරණය කිරීම හා සම්බන්ධ කරුණු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

තැපැල් මුද්‍රා යන්ත්‍රය

- ලිපි තැපැල් කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගත හැකි වීම
- මුද්දර ඇලවීමේ කාලය අවම කර ගත හැකි වීම
- මුද්දර අස්ථාන ගත වීම වැළැක්වීම.
- තැපැල් මුද්‍රා යන්ත්‍රය එක් නිලධාරියකු යටතේ තැබීම නිසා වංචා වීම වැළැක්විය හැකිය.

(ලකුණු 03යි)

(iv) පුවත්පත් ආයතනයක දක්නට ලැබෙන පහත එක් එක් අංශවල ක්‍රියාකාරිත්වයට අදාළ කරුණු දෙක බැගින් විස්තර කරන්න.

(අ) ප්‍රවෘත්ති අංශය (news section)
(ආ) විශේෂාංග අංශය (feature section)

ප්‍රවෘත්ති අංශය

- ඉතා වැදගත් කාර්යය ඉටු කරන අංශයකි.
- දේශීය හා විදේශිය අංශ වෙනුවෙන් කොටස් දෙකකට බෙදෙයි.
- මෙම ප්‍රවෘත්ති අංශ දෙකටම ප්‍රවෘත්ති සංස්කාරක කර්තෘවරයෙක් සිටියි.
- ප්‍රවෘත්ති අංශයේ මාණ්ඩලික වාර්තාකරුවන් හා ප්‍රාදේශීය වාර්තාකරුවන්ගේ සහය ලබා ගනියි.

විශේෂාංග අංශය

- ප්‍රවෘත්තිවල අතිරේකව විශේෂ මාතෘකා යටතේ ලිපි/ පිටු පලකිරීම සිදු කරන්නේ මෙම අංශය යටතේය. (කාන්තා, ළමා, විලාසිතා, ආගමික, ව්‍යාපාරික, පාරිසරික , ක්‍රීඩා, සිනමා, නාට්‍ය, සාහිත්‍ය පිටු හෝ ලිපි)
- වැඩි පාඨක පිරිසක් ග්‍රහණය කර ගැනීමට හැකි වීම
- විශේෂාංග පිටුව සංස්කරණය කරනු ලබන්නේ විශේෂාංග කර්තෘවරයා විසිනි.
- පුවත්පතක කාටූනය ද විශේෂාංගයකි.

(ලකුණු 04යි)

4. (i) ආසියාවේ ප්‍රථම ගුවන්විදුලි සේවාව ආරම්භ කළ රට කුමක් ද?

ශ්‍රී ලංකාව

(ලකුණු 01යි)

(ii) හිමිකම සම්බන්ධයෙන් රාජ්‍ය දායකත්වය සහිත දේශීය ගුවන්විදුලි ආයතන දෙකක් නම් කරන්න.

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (SLBC)
- ලක්හඬ ගුවන්විදුලි සේවය (ITN)

(ලකුණු 02යි)

(iii) ගුවන්විදුලි මාධ්‍යය පරිහරණය මගින් ළමුන්ට ලබා ගත හැකි ඉගෙනුම් අවකාශ තුනක් කෙටියෙන් විස්තර කරන්න.

- ශ්‍රවණය හුරුවෙයි.
- විවිධ වචන හා වාක්‍ය රටා උගනියි.
- විවිධ කථා විලාස උගනියි.
- පරිකල්පන ශක්තිය දියුණු වේ.
- සෞන්දර්යාත්මක සිතුවිලි පෝෂණය වේ.
- සංගීතයට, ගායනයට, වින්දනයට හුරු වෙයි.

(කෙටියෙන් විස්තර කර තිබිය යුතු ය.)
(කරුණු 03ම නිවැරදි නම් පමණක් එක් ලකුණක් ප්‍රදානය කරන්න.
කරුණු 02ක් සඳහා ලකුණු ලබා නොදේ.)
(ලකුණු 03යි)

(iv) ගුවන්විදුලි ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී පෝල් ඩී. මැසනියර් විසින් ඉදිරිපත් කරන ලද සාධක හතරෙහි වැදගත්කම් වෙන වෙනම පැහැදිලි කරන්න.

- නිවැරදි බව

  තොරතුරු වාර්තා කිරීමේදී වැදගත්ම ගුණාංගය ලෙස නිවැරදි බව යන්න සැලකිය හැකිය. තොරතුරකට අදාළ සෑම කරුණක් ම සත්‍ය විය යුතුය. එම තොරතුර නැවත සනාථ කර ගැනීමට හැකි විය යුතුය. මෙහිදී අදාළ සිදු වීම්, පුද්ගල නම්, ස්ථාන, වෘත්තීන්, දින, තොරතුරු මූලාශ්‍රයන් නිවැරදි වීම වැදගත් වේ.

- සමතුලිත බව

  සමතුලිත බව යන්නෙහි මූලික අදහස අපක්ෂපාතී වීමයි. පුද්ගලික ලැදියාව, වාසි, අභිමතාර්ථ, නැඹුරුව ආදියෙන් තොරව සියලු පාර්ශව නියෝජනය කරමින් තොරතුරු සමබරව ඉදිරිපත් කළ යුතුය. තොරතුරුවල වටිනාකම ඉහළ නැංවීමට එය හේතු වේ. සිදුවීමට අදාළ සියලු පාර්ශවයන්හි තොරතුරු සමබරව ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.

- පැහැදිලි බව

    තොරතුරුවල පැහැදිලි බව ආරක්ෂා වීමට සරල හා නිරවුල් භාෂාවක් අවම වශයෙන් භාවිත කිරීම ආදිය වැදගත් වෙයි. සංකීර්ණ භාෂා රටා, වැරදි උච්චාරණ හෝ අපැහැදිලි රූපමය දර්ශනවලින් තොරවීම ද පැහැදිලි බවට හේතු වේ. ඕනෑම අයෙකුට පහසුවෙන් අවබෝධ කර ගත හැකි වදන් මාලාවන් යොදා ගැනීම මඟින් පැහැදිලි බව ආරක්ෂා වේ. කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම ද වැදගත් වේ.

- විශ්වසනීයත්වය

    නිවැරදි බව, පැහැදිලි බව, සමතුලිත බව එක්වීමෙන් අදාළ තොරතුරු කෙරෙහි විශ්වසනීයත්වය ගොඩනැගේ. ඉන් එක් අංශයක් හෝ බිඳ වැටීමෙන් විශ්වසනීයත්වය සීමා විය හැකිය. ප්‍රවෘත්ති ආයතනයෙහි ප්‍රතිරූපය ගොඩනැගීම කෙරෙහි විශ්වසනීයත්වය තීරණාත්මක ලෙස බලපායි.

(ලකුණු 04යි)

5. ජනමාධ්‍ය මගින් නිර්මාණාත්මක සන්දේශ ග්‍රාහකයා වෙත ලබාදීමේ දී ආචාරධර්ම පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

(i) නිර්මාණයක දැකිය හැකි ගුණාංග දෙකක් ලියන්න.

- අපූර්වත්වය
- නැවුම් බව
- සුවිශේෂී බව
- ප්‍රයෝජනවත් බව
- අර්ථ සම්පන්න බව
- ගුණාත්මක සන්නිවේදනයක් සිදු වීම
- ඉහළ රුචිකත්වයක් ඇති කිරීම
- සංවේදී බව
- සියුම් ලෙස සිතීමේ හැකියාව
- ආකර්ෂණීය බව

(මෙම ලක්ෂණ අතරින් දෙකක් සඳහන් කර තිබේ නම් පමණක් ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 01යි)

(ii) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය භාවිතයට අදාළ ආචාර ධර්ම පද්ධති දෙකක් නම් කරන්න.

- ජාත්‍යන්තර ජනමාධ්‍යවේදීන්ගේ සංසදයේ ආචාරධර්ම මාලාව
- ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව/ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ ආචාරධර්ම ලේඛනය

(ලකුණු 02යි)

(iii) රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න.

- රූපවාහිනී මාධ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි.
- රූපවාහිනී මාධ්‍ය සමීප ගෘහස්ථ මාධ්‍යයකි.
- රූපවාහිනී මාධ්‍ය සජීවී මාධ්‍යයකි.
- රූපවාහිනී මාධ්‍ය විද්‍යුත් ජනමාධ්‍යයකි.
- රූපවාහිනී මාධ්‍ය ආකර්ෂණීය මාධ්‍යයකි.
- රූපවාහිනී මාධ්‍ය අස්ථායි මාධ්‍යයකි.
- රූපවාහිනී මාධ්‍ය වියදම් අධික මාධ්‍යයකි.

(මෙයින් ලක්ෂණ 03ක් කෙටියෙන් විස්තර කර තිබිය යුතු ය.)

(ලකුණු 03 යි)

(iv) 'රූපවාහිනී මාධ්‍යය හා ග්‍රාහකයා අතර අන්‍යෝන්‍ය බලපෑම්' පිළිබඳ පහත කරුණු යටතේ පාසල් බිත්ති පුවත්පතට ලිපියක් සම්පාදනය කරන්න.

(අ) රූපවාහිනිය ග්‍රාහක චර්යාව වෙනස් කරයි.

(ආ) රූපවාහිනිය දෛනික න්‍යාය පත්‍රය සකසයි.

- රූපවාහිනි මාධ්‍ය මගින් ග්‍රාහක චර්යාව වෙනස් කරයි.

  ජනප්‍රිය විලාසිතා, ප්‍රියකරන ආහාර, කථා කරන භාෂාව, පරිහරණය කරන උපකරණ ආදිය මාධ්‍ය සන්දේශ මගින් හඳුන්වා දෙයි.

  - පාරිභෝගික මිලදී ගැනීමේ රටාවට බලපෑම් කරයි.
  - පුද්ගල සම්බන්ධතා කෙරෙහි බලපෑම් ඇති කරයි
  - යෝග්‍ය මෙන්ම අයෝග්‍ය පුරුදු ඇති කරයි.
  - අනුකරණය
  - ඇබ්බැහි වීම
  - උන්මාදය

- දෛනික න්‍යාය පත්‍රය හසුරුවනු ලබයි.
- උදෑසන අවදි වීම, පාඩම් කිරීම, ආහාර ගැනීම, විවේකය ගත කිරීම වැනි දෛනික කටයුතු සැලසුම් කරන්නේ මාධ්‍ය වැඩසටහන් අනුව ය.
- මාධ්‍ය මගින් ගොඩනගන ප්‍රමුඛතාවන්ට අනුකූලව පුද්ගලයාගේ සිතුම් පැතුම් හා චර්යාවන් හැඩ ගස්වන බව මෙහි මූලික අදහසයි.

(රූපවාහිනි මාධ්‍යයට විශේෂිතව විස්තර කර තිබීම වැදගත් ය.)

(ලකුණු 04 යි)

6. ටෙලිනාට්‍ය මුහුරත් උළෙලක නළු නිළියන් හඳුන්වාදෙන මොහොත සිත්ගන්නා සුළු විය.

(i) ටෙලිනාට්‍යයේ ප්‍රධාන නිළිය ප්‍රධාන නළුවාට වඩා අඩුරු සමක් ඇති යුවතියක් වීම කාගේත් කතාබහට ලක් විය. මෙය කවර සංකල්පයක් යටතේ විග්‍රහ කළ හැකි ද?

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය
- පුම්තිරි බව/ පුම්තිරි භාවය
- සමාජ ලෛලිකත්වය

(ලකුණු 01 යි)

(ii) ඉහත අවස්ථාවට අදාළව ලබාගත් ඡායාරූප ප්‍රවෘත්තිමය වටිනාකමින් හීන විය. එසේ වීමට හේතු දෙකක් දක්වන්න.

- කාලෝචිත නොවීම
- කැපීපෙනීමක් නොමැති වීම
- බලපෑම් නොමැති වීම
- සමීපතාවක් නොමැති වීම
- අසාමාන්‍ය නොවීම/ සාමාන්‍ය වීම
- නැවුම් බවක් නොමැති වීම
- ගැටුම්කාරී බවක් නොමැති වීම

(මෙම කරුණු ඉහත අවස්ථාවට අදාළව ලිවිය යුතුය)

(ලකුණු 02 යි)

(iii) ටෙලිනාට්‍යයක දී නිශ්චල ඡායාරූප භාවිතයට ගන්නා අවස්ථා තුනක් කෙටියෙන් විස්තර කරන්න.

- රූපගත කිරීම්වලදී පාත්‍ර වර්ගයාගේ දර්ශනතලවල අංග රචනා, වස්ත්‍රාභරණ හා පසුතල ආදියෙහි අඛණ්ඩතාව පවත්වා ගැනීම
- ටෙලි නිර්මාණයක ප්‍රචාරණය සඳහා කෙරෙන පෝස්ටර්, පත්‍රිකා, පුවරු, පින්තූර ආදියට ඇතුළත් කිරීමට
- ටෙලි නිර්මාණ කර්මාන්තයේ නියැළෙන ශිල්පීන්ගේ දත්ත හා තොරතුරු සම්පාදනය, ජනප්‍රියත්ව ගොඩ නැංවීම හා පෞද්ගලික මතක සටහන් පවත්වා ගැනීම
- ටෙලි නාට්‍ය, සමරු ග්‍රන්ථ, විචාර ග්‍රන්ථ, සඟරා, සමරු කලාප ආදි ටෙලි නාට්‍ය සාහිත්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට
- සිනමා විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතුවලදී යොදා ගැනීම හා රූපවාහිනී ටෙලිනාට්‍ය නිර්මාණ කටයුතු පිළිබඳ මුද්‍රිත මාධ්‍යයෙන් කෙරෙන වෙළෙඳ දැන්වීම් හා විශේෂාංගවලට ඇතුළත් කිරීමට

(ලකුණු 03 යි)

(iv) 'රාජ්‍ය රූපවාහිනී මාධ්‍ය ආයතන හා රජය අතර සම්බන්ධය' පිළිබඳව පහත කරුණු යටතේ රචනාවක් සම්පාදනය කරන්න.

(අ) රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීම

(ආ) මහජන මතය රජය කෙරෙහි හිතකරව පවත්වාගෙන යාම

(අ) රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීම

- රජයේ ව්‍යාපෘති සම්බන්ධව ජනතාවගේ කැමැත්ත ලබා ගැනීමට සහ විවේචන මගහැරවීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලවල් සංවිධානය කිරීම.
- නිරන්තරයෙන්ම රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ධනාත්මක ආකල්ප ඇතිවන ආකාරයේ වැඩසටහන් සංවිධානය කිරීම.
- ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා පවත්වමින් මතුවන ගැටලු චෝදනා යනාදියට අදාළව ගනු ලබන සාධනීය පියවර පිළිබඳ තොරතුරු මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීම.
- ව්‍යාපෘති තුළින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යාපෘති සැලසුම් පිළිබඳව පාර්ශවකරුවන් (ජනතාව ද ඇතුළුව) පූර්ව දැනුවත් කිරීම.

(ආ) මහජන මතය රජය කෙරෙහි හිතකරව පවත්වාගෙන යාම

- රාජ්‍ය මාධ්‍යන්ගේ ප්‍රධානම කාර්යය වන්නේ රජය පිළිබඳ යහපත් හා හිතකර ජනමතයක් නිර්මාණය කිරීම.
- විවේචන සහ විරෝධතාවලට සාධනීය ලෙස ප්‍රතිචාර දැක්විය යුතුය.
- රට ගොඩ නැගීමේ රජය ගෙනයන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අවශ්‍ය දැනුවත් කිරීම් ජනමාධ්‍ය විසින් කළ යුතු ය.
- ව්‍යාපෘති පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ලකුණු 04 යි)

7. මාධ්‍ය විචාරයේ දී සන්දේශය හුදකලා කොට සැලකීම සාධාරණ නොවේ.

(i) සන්දේශයකින් ඉදිරිපත් වන අදහස කුමක් ද යන්න තීරණය කිරීමට බලපාන සාධකයක් නම් කරන්න.

- මාධ්‍ය ආයතනයේ හිමිකාරිත්වය
- මාධ්‍ය හා සම්බන්ධ ආර්ථික හා සමාජ සාධක
- අදාළ කාලයේ පවතින දේශපාලන වාතාවරණය
- සංස්කෘතික පසුබිම

(ලකුණු 01 යි)

(ii) විචාරශීලී ග්‍රාහකයකු සතු විය යුතු නිපුණතා දෙකක් දක්වන්න.

- ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන දේ නිසි ලෙස අවබෝධ කර ගැනීමේ හැකියාව
- මාධ්‍ය මගින් සඟවන දේ කුමක් දැයි අවබෝධ කර ගැනීමේ හැකියාව
- ජනමාධ්‍ය කටයුතු කරන්නේ කුමන අරමුණකින්ද යන්න තේරුම් ගැනීමේ හැකියාව
- ජනමාධ්‍ය උත්සාහ දරන්නේ තමා කෙබඳු පුද්ගලකු බවට පත් කිරීමට ද යන්න අවබෝධ කර ගැනීමේ හැකියාව
- ග්‍රාහකයා පොළඹවා ගැනීමට මාධ්‍ය විසින් ගන්නා උපායමාර්ග තේරුම් ගැනීමට ඇති හැකියාව
- මාධ්‍ය කුමක් ඉදිරිපත් කළ ද තමාට අවශ්‍ය දේ පමණක් තෝරා බේරාගෙන පරිහරණය කිරීමට ඇති හැකියාව
- මාධ්‍ය වෙත මාධ්‍ය ක්‍රියාකාරීත්ව පිළිබඳ තමාගේ ප්‍රතිචාර පෞද්ගලිකව හා සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම මගින් මාධ්‍ය සමග අන්තර් සම්බන්ධතාවක් පවත්වා ගැනීමට ඇති හැකියාව

(ලකුණු 02යි)

(iii) ගුවන්විදුලි මාධ්‍යය සඳහා පිටපත් රචනයේ දී සපුරාලිය යුතු කොන්දේසි තුනක් විස්තර කරන්න.

- භාෂාවේ ස්වරූපය
  ලියන්නේ කියවීමට නොව කථාබහට ය. එය ලේඛන ව්‍යවහාරය නොව කථන ව්‍යවහාරයකි.

- ආමන්ත්‍රණ ස්වරූපය
  ලිවිය යුත්තේ එක් පුද්ගලයකු අරඹයා ය. එනම් පුද්ගලික ඇමතුමකි. එය ඔබ හා මම අතර කෙරෙන්නෙකි. එම ආමන්ත්‍රණය මිත්‍රශීලී විය යුතුය.

- ශ්‍රවණ ස්වරූපය
  ඇසෙන්නේ එක්වරක් පමණි. එහෙයින් ඇසූ මුල් අවස්ථාවේදීම අසන්නාට තේරුම් යා යුතුය.

- ශබ්ද ස්වරූපය
  යොදාගන්නේ ශබ්දය පමණක් බැවින් ශබ්දය මගින් සියලු දේ මනසේ චිත්‍රණය විය යුතු ය.

(ලකුණු 03යි)

(iv) 'අවබෝධයෙන් යුතුව සමාජ මාධ්‍ය පරිශීලනය කරමු' යන මැයෙන් කරුණු හතරක් යටතේ පාසල් උදෑසන රැස්වීමේ දී සිදු කරන කතාවකට අදාළ පිටපතක් සකස් කරන්න.

- තමා පිළිබඳ සත්‍ය තොරතුරු වසන් කිරීමෙන් වැළකීම.
- අන් අය රැවටීමෙන් වැළකීම.
- වැරදි හා අසත්‍ය තොරතුරු ජාලයට එක් කිරීමෙන් වැළකීම.
- තමන්ගේ පෞද්ගලික තොරතුරු අනවශ්‍ය අය වෙත ලබා දීමෙන් වැළකීම.
- සමාජ සදාචාරයට හානි නොවන සේ භාවිත කිරීම.
- අන් අයගේ පෞද්ගලිකත්වයට හානි නොවන සේ භාවිත කිරීම.
- ලැබෙන තොරතුරු තෝරා බේරාගෙන හුවමාරු කර ගැනීම කළ යුතුය.
- නෛතික සීමාවන් පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීම.
- නව මාධ්‍ය සාක්ෂරතාවෙන් යුතුව සමාජ මාධ්‍ය පරිහරණය කිරීම

(රැස්වීමේදී සිදු කරන කථාවට අදාළව පිළිතුරු ලියා තිබිය යුතුය)

(ලකුණු 04යි)

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

89 - නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ....
....
.... √ △ $\frac{4}{5}$

(ii) ....
....
.... √ △ $\frac{3}{5}$

(iii) ....
....
.... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ —එකතුව→ □ $\frac{10}{15}$

බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.

***

89 - නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය

එක් එක් ප්‍රශ්නයේ ලකුණු බෙදීයාම පිළිබඳ සාරාංශය

I පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් යුක්තය. නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 40 කි.

II පත්‍රය

1. පිළිතුර (අනිවාර්යයි) සඳහා	-	ලකුණු 20
2. පිළිතුර සඳහා	-	ලකුණු 10
3. පිළිතුර සඳහා	-	ලකුණු 10
4. පිළිතුර සඳහා	-	ලකුණු 10
5. පිළිතුර සඳහා	-	ලකුණු 10
6. පිළිතුර සඳහා	-	ලකුණු 10
7. පිළිතුර සඳහා	-	ලකුණු 10

I පත්‍රයට	-	ලකුණු 40
II පත්‍රයට 1 පිළිතුර	-	ලකුණු 20
2 සිට 7 දක්වා තෝරාගත් පිළිතුරු 4 x 10	-	ලකුණු 40
		ලකුණු 100

II පත්‍රයට ලකුණු බෙදී යන ආකාරය

1 පිළිතුර	- (i)	කොටස	-	ලකුණු - 15
	(ii)	කොටස	-	ලකුණු - 05
2 පිළිතුර	- (i)	කොටස	-	ලකුණු - 03
	(ii)	කොටස	-	ලකුණු - 03
	(iii)	කොටස	-	ලකුණු - 04
3 පිළිතුර	- (i)	කොටස		ලකුණු - 03
	(ii)	කොටස		ලකුණු - 03
	(iii)	කොටස		ලකුණු - 04
4 පිළිතුර	- (i)	කොටස		ලකුණු - 04
	(ii)	කොටස		ලකුණු - 03
	(iii)	කොටස		ලකුණු - 03
5 පිළිතුර	- (i)	කොටස		ලකුණු - 04
	(ii)	කොටස		ලකුණු - 03
	(iii)	කොටස	-	ලකුණු - 03
6 පිළිතුර	- (i)	කොටස		ලකුණු - 03
	(ii)	කොටස		ලකුණු - 03
	(iii)	කොටස	-	ලකුණු - 04
7 පිළිතුර	- (i)	කොටස		ලකුණු - 03
	(ii)	කොටස		ලකුණු - 03
	(iii)	කොටස		ලකුණු - 04

I පත්‍රයේ අභිමතාර්ථ

1. ඉරටු කැබලි කිහිපයක් දුන් විට ඒ මගින් ජ්‍යාමිතික හැඩතල නිර්මාණය කරයි
2. සෘජුකෝණාස්‍රයක පාද හතරක් ස්පර්ශ වන සේ ඇඳිය හැකි නිර්මාණය ඉලිප්සයක බව නම් කරයි.
3. වෘත්තයක් නිර්මාණ කිරීමට අවශ්‍ය සාධක විස්තර කරයි.
4. ජ්‍යාමිතික නිර්මාණ කිරීමට අවශ්‍ය සාධක විස්තර කරයි.
5. පර්යාලෝක ක්‍රමය පිළිබඳ විස්තර කරයි.
6. ඉලිප්සයක නාභි දෙක නිර්මාණය කරයි.
7. ආවුද උපකරණවලින් සිදු කර ගත හැකි කාර්යයන් නම් කරයි.
8. තුනී ලෝහ තහඩු නිර්මාණයේදී හැඩ ගැන්වීම සඳහා අවශ්‍ය කරුණු අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
9. ලෝහ තහඩුවක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු විශේෂ කරුණු අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
10. ලෝහ තහඩු මිටියම් කිරීමට අවශ්‍ය ආවුද උපකරණ තෝරා ගනියි.
11. ලෝහ භාණ්ඩ නිෂ්පාදනයේදී ඒවායෙහි ගුණ උපයෝගී කර ගනියි.
12. ලෝහයක ගිනිමල් පරීක්ෂාව මගින් ලෝහය කුමක් දැයි හඳුනාගෙන ප්‍රකාශ කරයි.
13. කම්බි හා තහඩු මැනීමට භාවිතා කරන උපකරණ තෝරා ගනියි.
14. සියුම් ස්ථානයක පිටත මිනුම් ලබා ගත හැකි උපකරණය නම් කරයි.
15. මිටියක් වර්ග කෙරෙන සාධක නම් කරයි.
16. සපර්ශක ආමානයකින් සිදු කර ගත හැකි කාර්යයන් නම් කරයි.
17. ස්වයං ලිහිසි ලෝහ වර්ග හඳුනාගෙන ප්‍රකාශ කරයි.
18. වාත්තු කර්මාන්තයේදී භාවිතා කරන උපකරණවල කාර්යයන් විස්තර කරයි.
19. භංගුරතාවයට ඔරොත්තු දිය හැකි විස්තර කරයි.
20. ගින්නක් යනු කුමක් දැයි විස්තර කරයි.
21. මූලික චලිතාකාර විස්තර කරයි.
22. මෘදු පෑස්සීම සඳහා භාවිතා කරන බවුතයක ගුණ නම් කරයි.
23. විදුලි මගින් ඇති බන ගින්නක දී අවබෝධයෙන් යුතුව කටයුතු කරයි.
24. මුට්ටු කිරීම සඳහා භාවිතා කරන උපකරණ නම් කරයි.
25. ඔක්සිජන් පීඩන ආමානයක උපාංග නම් කරයි.
26. ගැටලු නිරාකාරණ ක්‍රියාවලියට අදාළ විසඳුමක තිබිය යුතු ගුණාංග විස්තර කෙරෙන මාතෘකාව නම් කරයි.
27. පටි මගින් ජවය සම්ප්‍රේෂණයේ විශේෂ ලක්ෂණ නම් කරයි.
28. වායු මගින් ජවය සම්ප්‍රේෂණය විශේෂ ලක්ෂණ නම්කරයි.
29. දෙපහර පෙට්‍රල් එන්ජිමකට නිවැරදි අනුපාතයකට ස්නේහන තෙල් මිශ්‍ර කරයි.
30. තාප නිනාල සිසිලන ක්‍රමයේ දුබලතා හඳුනාගෙන ප්‍රකාශ කරයි.
31. සිසිලණ පද්ධතියේ දෝෂ හඳුනාගෙන දුබලතා ඒවා අලුත් වැඩියා කරයි.
32. ගියර රෝද ක්‍රමයේ වේගය ව්‍යාවර්ථය කුමක්දැයි නම් කරයි.
33. වායු සිසිලන එන්ජිමක සිසිලන වරල් මගින් ඉටු කරන කාර්යයන් නම් කරයි.
34. යතුරු පැදියන සංඥා පද්ධතියේ උපාංග සම්බන්ධ කරයි.
35. එලවුම දම්වැලක් ස්නේහනය කිරී සඳහා සුදුසු ස්නේහන තෙල් වර්ගය තෝරා ගනියි.
36. යතුරු පැදියක පිටුපස පහන සඳහා යොදන බල්බයේ සූත්‍රිකාවල ක්ෂමතාවයෙන් හඳුනාගෙන උචිත බල්බයක් සවි කරයි.
37. තර්මෝස්ටැට් වැල්වයක පිහිටුම් ස්ථානය විස්තර කරයි.
38. දගර කදක විකේන්ද්‍රතාවය අනුව පිස්ටනයේ චලිත දුර ගණනය කරයි.
39. ඝර්ෂණ බලය ක්‍රියාත්මක වන ආකාරය ඒ සඳහා උචිත ස්නේහනය කරන ආකාර උදාරණ සහිතව දක්වයි.
40. ඝෘතපෝෂණ ස්නේහන ක්‍රමයේ ක්‍රියාකාරීත්වය විස්තර කරයි

II පත්‍රයේ අභිමතාර්ථ

01. (i) සමාංශක වස්තුවක ඉදිරි පෙනුම, පැති පෙනුම හා සැලැස්ම තෙවන කෝණ ප්‍රක්ශේපණ ක්‍රමයට අඳියි.

(ii) ත්‍රිකෝණයක පරිවෘත්තය ඇඳීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

02. (i) උද්‍යාන බංකුව පදෑමිට අවශ්‍යය උපකරණ හා ආවුධ සඳහන් කරමින් ක්‍රියාවලිය විස්තර කරයි.

(ii) කල්පැවැත්ම සඳහා අනුගමනය කළ හැකි නිමහම් කාර්යය සඳහන් කරයි.

(iii) දී ඇති සැලසුම වඩාත් ශක්තිමත් කිරීමට නව නිර්මාණයක් කරන ආකාරයරූප සටහන් මගින් ප්‍රදර්ශන කරයි.

03. (i) යතුරු පැදියක සංඥා පහන් පරිපථයක රූප සටහන් ඇද කොටස් නම් කරයි.

(ii) යතුරු පැදියක විදුලි පහන් දැවී යාමට හේතු සඳහන් කරයි.

(iii) ඊයම් අම්ල බැටරියක අභයන්තරය සකස් වී ඇති ආකාරය රූප සටහන් මගින් විස්තර කරයි.

04. (i) ආරක්ෂක පූර්වෝපායක් අනුව ක්‍රමානුකූල වැඩ බිමක් පවත්වාගෙන යාමට අවශ්‍ය සාධක හඳුනා ගනී

(ii) කර්මාන්ත ශාලාවක ප්‍රමාණවත් ඉඩකඩ තිබීමේ වාසි සඳහන් කරයි.

(iii) අනතුරු සංඥාවක් වැඩ බිමක නිකුත් කිරීමේදී අඩංගු විය යුතු ලක්ෂණ ලැයිස්තු ගත කරයි.

05. (i) තුනී ලෝහ තහඩු භාවිතය ව්‍යාප්තවීමට බලපාන සාධක සඳහන් කරයි.

(ii) තුනීලෝහ තහඩු භාවිතා කර සිදු කරනු ලබන නිෂ්පාදන කර්මාන්තය සඳහන් කරයි.

(iii) භාවිතය අනුව තුනී ලෝහ තහඩු බෙදා වෙන් කර උදාහරණ සහිතව ඉදිරිපත් කරයි.

06. (i) තෙක් වැලි වාත්තු කිරීම් ක්‍රමය විස්තර කරයි.

(ii) වාත්තු කිරීම මගින් භාණ්ඩ නිපදවීමෙන් ලැබෙන වාසි විස්තර කරයි.

(iii) වාත්තු කිරීමෙන් පසු භාණ්ඩ නිමහම් කිරීමේ ක්‍රියාවලියේ ආකාර 04 විස්තර කරයි.

07. (i) ජල සිසිලන ක්‍රමයේ භාවිතා කරනු ලබන සොඩනල නිපදවා ඇති ආකාරය විස්තර කරයි.

(ii) ජල සිසිලන ක්‍රමයේ දෝෂ නිසා එන්ජිම ක්‍රියාකාරි උෂ්ණත්වයට පැමිණීම ප්‍රමාද වීමෙන් ඇති වන අවාසිදායක තත්ත්වයන් සඳහන් කරයි.

(iii) විකිරකයේ යොදා ඇති පීඩන පියනේ රික්ත වැල්වය ක්‍රියාත්මකවන ආකාරය පැහැදිලි කරයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

89 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය I, II
வடிவமைப்பும் இயந்திரத் தொழிட்பவியலும் I, II
Design and Mechanical Technology I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය I

උපදෙස්:

- ※ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. 

ඉරටු කැබලි පහක් අහඹු ලෙස මේසයක් මතට පතිත කළ විට ඒවා පිහිටි ආකාරය රූපයේ දක්වා ඇත. රූපයේ දැකිය හැකි ජ්‍යාමිතික හැඩතල වන්නේ,

(1) ත්‍රිකෝණ හා චතුරස්‍ර ය.
(2) චතුරස්‍ර හා පංචාස්‍ර ය.
(3) ත්‍රිකෝණ හා සෘජුකෝණාස්‍ර ය.
(4) පංචාස්‍ර හා ෂඩාස්‍ර ය.

2. 

මෙම සෘජුකෝණාස්‍රයේ AB, BC, CD හා DA යන පාද හතර ම ස්පර්ශ වන සේ නිර්මාණය කළ හැකි ජ්‍යාමිතික රූපය,

(1) සමද්විපාද ත්‍රිකෝණයක් වේ.
(2) විෂමපාද ත්‍රිකෝණයක් වේ.
(3) වෘත්තයක් වේ.
(4) ඉලිප්සයක් වේ.

3. පහත සඳහන් සාධක අතුරෙන් එම සාධකය පමණක් දුන් විට වෘත්තයක් ඇඳීමට **නොහැකි** සාධකය කුමක් ද?

(1) කේන්ද්‍රය (2) අරය (3) විෂ්කම්භය (4) පරිධිය

[දෙවැනි පිටුව බලන්න.

4. L, M සහ N රූපසටහන්වලට අදාළ ප්‍රකාශ තුනක් පහත දී ඇත.



A – L හි චාපය ඇඳීමට අවශ්‍ය කේන්ද්‍රය කෙසේවත් සොයාගත නොහැකි ය.
B – M රූපයේ වෘත්ත දෙකට ම වෙන වෙන ම කේන්ද්‍ර දෙකක් ඇත.
C – රූපය N හි $PQRS$ යන සමචතුරස්‍රයේ ශීර්ෂවල ස්පර්ශ වන සේ වෘත්තයක් ඇඳීමට O යන ස්ථානය කේන්ද්‍රය වශයෙන් භාවිතයට ගත යුතු ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා C සියල්ලම ය.

5. පහත රූපය ඇඳීම සඳහා අනුගමනය කර ඇති ක්‍රමය කුමක් ද?



(1) සෘජු ප්‍රක්ෂේපණ ක්‍රමය
(2) සමාංශ ප්‍රක්ෂේපණ ක්‍රමය
(3) පර්යාලෝක ක්‍රමය
(4) සම්මත නොවන ක්‍රමය

6. පහත රූපයේ $AO = OB$ ද, $CO = OD$ ද වේ.



ඉලිප්සයක් නිර්මාණය කිරීම සඳහා මූලිකව රේඛා හා ලක්ෂ්‍යයන් සලකුණු කර ඇති ඉහත රූපයේ X හා Y ලක්ෂ්‍යයන් දෙක අතර දුර යනු,

(1) මහා අක්ෂයේ දුරයි. (2) සුළු අක්ෂයේ දුරයි.
(3) නාභි දෙක අතර දුරයි. (4) නියාමක අක්ෂීය දුරයි.

7. යාන්ත්‍රික තාක්ෂණ ක්‍රියාකාරකමක දී, එක් යන්ත්‍ර කොටසක ඇති මිනුමක් තවත් යන්ත්‍ර කොටසක ලකුණු කරගැනීම සඳහා යොදාගත හැකි සරල උපකරණයක් වන්නේ,

(1) වානේ කෝදුවයි. (2) ජෙනි කලපාසයයි. (3) දුනු බෙදුම් කටුවයි. (4) මිනුම් පටියයි.

8. මෘදු වානේ තුනී තහඩුවක, සරල රේඛාවක් ඔස්සේ සෘජුකෝණී කාණු හැඩයක් නවාගැනීම සඳහා භාවිත කළ යුතු උපකරණ කට්ටලය කුමක් ද?

(1) බෝල පෙති මිටිය, කිණිහිරි සට්ටම (2) හරස් පෙති මිටිය, පුනීල සට්ටම
(3) කෙලින් පෙති මිටිය, පුලුක්කු සට්ටම (4) පැතලි මෘදු මිටිය, වට අඩි සට්ටම

[ඊළඟ පිටුව බලන්න

9. තුනී ලෝහ තහඩුවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම වර්තමානයේ සුලබව සිදුවේ. මේ සඳහා තහඩු තෝරාගැනීමේ දී, සැලකිය යුතු ප්‍රධාන ම කරුණ මින් කුමක් ද?
(1) මෘදු බව (2) ආඝාත්‍යතාව (3) සුවිකාර්යතාව (4) ආවේණික වර්ණය

10. තුනී මෘදු වානේ තහඩුවක් මට්ටම් කරගැනීම සඳහා වඩාත් ම සුදුසු මිටිය කුමක් ද?
(1) බෝල පෙති මිටිය
(2) හරස් පෙති මිටිය
(3) හතරැස් ලී අකමොලව
(4) පැතලි මෘදු මිටිය

11. පෑම් ලෝහයකට ම ආවේණික ගුණ කිහිපයක් පිහිටයි. ඒවා අතුරෙන් බොහෝ විට කාර්මිකයින්ට වැදගත් වන ගුණ මොනවා ද?
(1) භෞතික ගුණ (2) රසායනික ගුණ (3) තාපීය ගුණ (4) යාන්ත්‍රික ගුණ

12. පිඝිවිල් පරීක්ෂාව ලෝහ හඳුනාගැනීම සඳහා භාවිත වන ප්‍රචලිත ක්‍රමයකි. එක්තරා ලෝහ කැබැල්ලක් කැරකැවෙන රෝද පිඝිතලකට ස්පර්ශ කළ විට වී ඇට හැඩයේ ගිනිපුපුරු විහිදුන අතර, අතරින් පතර පුපුරායාම් ද සිදුවිය. මෙම ලෝහය කුමක්දැයි පහත දී ඇති ලෝහ අතුරෙන් තෝරන්න.
(1) ලෝකඩ (2) මෘදු වානේ (3) ආවුද වානේ (4) වීනච්චට්ටි

13. SWG ලෙස හඳුන්වන ආමානය කුමක් ද?
(1) සම්මත කම්බි ආමානය
(2) බර්මින්හැම් ආමානය
(3) ස්පර්ශක ආමානය
(4) සම්මත තහඩු ආමානය

14. සිහින් කම්බිවල හෝ සිහින් තහඩුවල පිටත මිනුම් වඩාත් නිවැරදිව මැනගැනීම සඳහා භාවිත කරන උපකරණය වන්නේ,
(1) පිටත කලපාසයයි.
(2) වර්නියර කලපාසයයි.
(3) මයික්‍රොමීටරයයි.
(4) දුනු බෙදුම් කටුවයි.

15. තාක්ෂණික කාර්යයන් සඳහා විවිධ මිටි වර්ග භාවිත කරයි. මිටියක 'ප්‍රමාණය' තීරණය කරනු ලබන ප්‍රධාන සාධකය කුමක් ද?
(1) මිටියේ දිග
(2) මිටියේ බර
(3) මිටියේ මුහුණත හැඩය
(4) මිටියේ පෙත්තේ හැඩය

16. ස්පර්ශක ආමානය භාවිත කළ හැකි මිනුම් ගැනීමේ අවස්ථාව කුමක් ද?
(1) වැඩ කොටසක දිග මැනීම
(2) වැඩ කොටසක පළල මැනීම
(3) වැඩ කොටසක ඝනකම මැනීම
(4) වැඩ කොටස් දෙකක් අතර පරතරය මැනීම

17. පහසු ක්‍රියාකාරිත්වය හා ගෙවීම අවම කිරීම සඳහා වැඩ කොටස් දෙකක් අතරට ලිහිසි ද්‍රව්‍ය යොදනු ලැබේ. පහත සඳහන් ලෝහ අතුරෙන් 'ස්වයං ලිහිසි' ලෝහය තෝරන්න.
(1) ඊයම් (2) තඹ (3) වීනච්චට්ටි (4) ලෝකඩ

18. වාත්තු කර්මාන්තයේ දී 'අරුව' යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමක් ද?
(1) වාත්තු පස් තද කිරීමට භාවිත කරන උපකරණය
(2) සාදන භාණ්ඩයේ හැඩයට සමානව සාදාගත් අච්චුව
(3) ලෝහ දියර ඇතුළු කිරීමේ සිදුර තැනීමට යොදාගන්නා උපකරණය
(4) වාත්තු පස් තෙත් කිරීමට යොදාගන්නා උපකරණය

19. කම්පනයට ඔරොත්තු දිය යුතු උපකරණවල/යන්ත්‍ර කොටස්වල බඳ කොටස නිමවා ඇති ලෝහය කුමක් ද?
(1) මෘදු වානේ (2) ඊයම් (3) සුදු යකඩ (4) වීනච්චට්ටි

20. තාපය හා ආලෝකය නිකුත් කරමින් සිදුවන රසායනික ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) තාපය හටගැනීම
(2) දහන පෝෂක සැපයීම
(3) ඔක්සිජන් සැපයීම
(4) ගින්න ඇතිවීම

21. ලක්ෂ්‍යයක් වටා චක්‍රීයව නොකඩවා ඇතිවන චලිතය හඳුන්වනුයේ,
(1) රේඛීය චලිතය ලෙස ය.
(2) අනුවැටුම් චලිතය ලෙස ය.
(3) භ්‍රමණ චලිතය ලෙස ය.
(4) දෝලන චලිතය ලෙස ය.

22. මොළොක් පොඩියෙන් පෑස්සීම සඳහා යොදාගන්නා කෙවේරි බඩුතයේ තලය නිමවා ඇත්තේ කුමන ලෝහයෙන් ද?
(1) පිත්තල (2) තඹ (3) ලෝකඩ (4) වීනච්චට්ටි

23. දෝෂ සහිත විදුලි රැහැන් සම්බන්ධතාවක් හෝ රැහැන් අධික ලෙස රත්වීම නිසා, ඇතිවන විදුලි ගින්නක දී කාර්මිකයකු විසින් පළමුව සිදු කළ යුත්තේ,

(1) ගිනි නිවන ඒකකයට දැනුම් දීමයි. (2) ක්ෂණිකව එම ස්ථානයෙන් ඉවත් වීමයි.
(3) වටිනා උපකරණ එම ස්ථානයෙන් ඉවත් කිරීමයි. (4) අදාළ ස්ථානයේ විදුලිය විසන්ධි කිරීමයි.

24. පහත රූපයේ දක්වා ඇති උපකරණය කුමක් ද?



(1) රැවිත කපන කටුව
(2) මිටියම් කටුව
(3) වාට්මුට්ටු කටුව
(4) හරස් කපන කටුව

25. මෙම රූපයෙන් දැක්වෙන්නේ වායු වෙල්ඩින් උපාංගයක් වන ඔක්සිජන් පීඩන ආමානයකි. මෙහි ඔක්සිජන් සිලින්ඩරයේ පීඩනය පෙන්වන ආමානය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?



(1) A
(2) B
(3) C
(4) D

26. නිර්මාණකරණ ක්‍රියාවලියේ දී විසඳුමේ තිබිය යුතු ගුණාංග දක්වනු ලබන්නේ,

(1) පිරිවිතර යටතේ ය. (2) ක්‍රියාකාරීත්වය යටතේ ය.
(3) සෞන්දර්යාත්මක බව යටතේ ය. (4) මානව ගතික ස්වභාවය යටතේ ය.

27. පැතලි පටි එළවුම් ක්‍රමය යොදාගෙන බලය සම්ප්‍රේෂණය කරන පද්ධතිවල දක්නට ලැබෙන ලක්ෂණය මින් කුමක් ද?

(1) නඩත්තු කටයුතු අවශ්‍ය නොවීම
(2) ජවය වැඩිදුරකට සම්ප්‍රේෂණය අසාර්ථක වීම
(3) විශාල ජවයක් සම්ප්‍රේෂණයට යෝග්‍ය නොවීම
(4) රෝද දෙකේ විෂ්කම්භ අසමාන වූ විට බල සම්ප්‍රේෂණය අසාර්ථක වීම

28. සම්පීඩනය කළ වාතය යොදාගෙන ජව සම්ප්‍රේෂණය කිරීමට සැකසූ පද්ධතිවල වාත සම්පීඩකයෙන් (Air Compressor) සිදු කරන කාර්යය කුමක් ද?

(1) සම්පීඩනය කිරීමට පරිසරයෙන් ඇදගන්නා වාතය පිරිසිදු කිරීම
(2) පරිසරයෙන් වාතය ඇදගෙන සම්පීඩන ටැංකියට සම්පීඩනය කිරීම
(3) සම්පීඩිත වාතය ගබඩා කරන අවස්ථාවේ ඇතිවන පීඩනය පාලනය කිරීම
(4) සම්පීඩන ටැංකිය තුළ අනවශ්‍ය වැඩි පීඩනය නිදහස් කිරීම

29. දෙපහර කුඩා එන්ජින් සඳහා යොදාගන්නා පෙට්‍රෝඹයිල් ක්‍රමයේ දී පෙට්‍රල් සහ ස්නේහන තෙල් මිශ්‍ර කරන අනුපාතය කවරේ ද?

(1) 10:1 (2) 12:1 (3) 15:1 (4) 25:1

30. එන්ජින් සිසිල් කිරීම සඳහා භාවිත කර ඇති තාප නිනාල සංසරණ ක්‍රමයේ ඇති විශේෂ වාසිදායක ලක්ෂණයක් වන්නේ,

(1) ජල පොම්පයක් නොමැති වීමයි. (2) විශාල ජල පරිමාවක් යොදාගෙන තිබීමයි.
(3) විශාල සොඬ නළ යොදාගෙන තිබීමයි. (4) ස්ථානීය එන්ජින්වලට වඩා යෝග්‍ය වීමයි.

31. එක්තරා මෝටර් රථයක අවාන් පටිය (Fan Belt) නිතර නිතර කැඩියන බව නිරීක්ෂණය විය. මෙම දෝෂයට හේතු විය හැක්කේ කුමක් ද?

(1) වැරදි අංකයක් සහිත අවාන් පටි භාවිතය
(2) අවාන් පටිය අඩු ආතතියකින් සිරු මාරු කර තිබීම
(3) අවාන් පටිය සම්බන්ධවන පුලි (Pulley)/කප්පි එක එල්ලේ නොතිබීම
(4) අවාන් පටිය වැඩි ආතතියකින් සිරු මාරු කර තිබීම

[පස්වැනි පිටුව බලන්න.

32. මෝටර් රථයක වැඩි ම කැරකැවීමේ බලය ඇත්තේ කුමන ගියරයේ ද?
(1) පළමුවන ගියරයේ (2) පසුගැසුම් ගියරයේ
(3) දෙවන ගියරයේ (4) තුන්වන ගියරයේ

33. වාත සිසිලන එන්ජිමක ඇති සිසිලන වරල් මගින් සිදු කරනු ලබන කාර්යය කුමක් ද?
(1) එන්ජිමේ වාතය ගැටෙන ක්ෂේත්‍රඵලය සීමා කිරීම
(2) එන්ජිමේ පුම්බකයේ (Blower) කල් පැවැත්ම වැඩි කිරීම
(3) එන්ජිමේ ඉන්ධන කාර්යක්ෂමතාව අඩු කිරීම
(4) එන්ජිමේ වාතය ගැටෙන ක්ෂේත්‍රඵලය වැඩි කිරීම

34. යතුරු පැදියක සංඥා පහන් ක්‍රියාකාරිත්වයට ඍජුව ම දායකවන උපාංගය කුමක් ද?
(1) සැණෙළිය (Flasher) (2) ධාරිත්‍රකය (Capacitor)
(3) පිළියවනය (Relay) (4) සෘජුකාරක හා ස්ථායි ඒකකය (R/R යුනිට්)

35. යතුරු පැදියක එළවුම් දම්වැල ස්නේහනය කිරීම සඳහා වඩාත් ම සුදුසු ස්නේහන ද්‍රව්‍ය කුමක් ද?
(1) ග්‍රීස් (2) SAE 90 ස්නේහන තෙල්
(3) SAE 30 ස්නේහන තෙල් (4) SAE 140 ස්නේහන තෙල්

36. යතුරුපැදියක නවතා තැබීමේ පහන (Parking Light) හා රෝධක පහන (Brake Light) ක්‍රියාත්මක වන්නේ එක ම බල්බයක පිහිටි සූත්‍රිකා (Filament) දෙකක් මගිනි. මෙම සූත්‍රිකා දෙකෙහි ක්ෂමතාවයන් කවරේ ද?
(1) 2 W සහ 7 W (2) 3 W සහ 12 W (3) 4 W සහ 17 W (4) 5 W සහ 21 W

37. නවීන මෝටර් වාහන එන්ජින්වල ජල සිසිලන පද්ධතියේ යොදා ඇති උෂ්ණත්ව පාලක වැල්වය පිහිටුවා ඇති ස්ථානය මින් කුමක් ද?
(1) එන්ජින් බඳේ ජල කුහර දෙකක් අතර
(2) සිලින්ඩර හිසත් විකිරකයේ ඉහළ ටැංකියක් අතර
(3) ජල පොම්පය හා එන්ජින් බඳ අතර
(4) විකිරකයේ පහළ ටැංකිය හා එන්ජින් බඳ අතර

38. තනි සිලින්ඩරයේ එන්ජිමක දඟර කඳක් රූපයේ දැක්වේ.



මෙහි දක්වා ඇති මිනුම්වලට අනුව එන්ජිමේ පිස්ටනයේ රේඛීය චලනය සිදුවන දුර ප්‍රමාණය කොපමණ ද?
(1) 3 cm (2) 6 cm (3) 9 cm (4) 12 cm

39. යාන්ත්‍රික තාක්ෂණයේ දී යන්ත්‍රවල ක්‍රියාකාරී කොටස්වලට අදාළව හමුවන ඝර්ෂණ අවස්ථා තුන් ආකාරයකි. පහත දැක්වෙන ඝර්ෂණය පාලනය කෙරෙන අවස්ථා අතුරෙන් 'ඝන ඝර්ෂණය' පාලනය කළ අවස්ථාවක් තෝරන්න.
(1) යතුරුපැදියක එළවුම් දම්වැල ස්නේහනය වීම
(2) එන්ජිමක දඟර කඳ බෙයාරින් ස්නේහනය වීම
(3) එන්ජිමක කැම් දණ්ඩේ ජර්නල ස්නේහනය වීම
(4) පෙට්‍රෝමයිල් ක්‍රමයෙන් එන්ජින් කොටස් ස්නේහනය වීම

40. කෘත පෝෂණ ස්නේහන ක්‍රමයේ දී තෙල්දෙනෙහි (sump) ඇති තෙල් එන්ජිමේ අදාළ ස්ථාන කරා පීඩනයකින් සපයයි. මෙම තෙල් පීඩනය එන්ජිමේ ඒ ඒ ස්ථානවල දී විවිධ ය. අඩු ම ස්නේහන තෙල් පීඩනය පවතින්නේ කුමන උපාංග ආශ්‍රිතව ද?
(1) මහකොන් බෙයාරිම් හා පිස්ටන් ඇණ ආශ්‍රිතව
(2) ප්‍රධාන තෙල් ගැලරිය හා සිලින්ඩර බිත්ති ආශ්‍රිතව
(3) වැල්ව එකලස හා සැලගිලි එකලස ආශ්‍රිතව
(4) ප්‍රධාන බෙයාරිම් හා කැම් දණ්ඩේ බෙයාරිම් ආශ්‍රිතව

[දෙවැනි පිටුව බලන්න

රහස්‍යයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2023 (2024)
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂයය අංකය / பாட இலக்கம்: **89**

විෂයය / பாடம்: **නිර්මානකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය**

I පත්‍රය - පිළිතුරු
Iபத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරෙහි අංකය விடை இல.
1.	1, 2, 4	11.	4	21.	3	31.	3
2.	4	12.	2	22.	2	32.	2
3.	1	13.	1	23.	4	33.	4
4.	3	14.	3	24.	3	34.	1
5.	3	15.	2	25.	2	35.	3
6.	3	16.	4	26.	1	36.	4
7.	1, 2, 3, 4	17.	3	27.	1	37.	2
8.	3	18.	2	28.	2	38.	4
9.	3	19.	1	29.	4	39.	1
10.	4	20.	4	30.	1	40.	3

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01×40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

89 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය	**I, II**
வடிவமைப்பும் இயந்திரத் தொழிட்பவியலும்	**I, II**
Design and Mechanical Technology	**I, II**

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. (i) පහත දී ඇති සමාංශක රූපය බලන්න.
සාජු ප්‍රක්ෂේපණ මූලධර්මයේ තෙවන කෝණ ක්‍රමය අනුගමනය කරමින් දී ඇති මිනුම්වලට අනුව සම්පූර්ණ පරිමාණයට පහත සඳහන් A, B සහ C පෙනුම් අඳින්න.
(මිනුම් දී ඇත්තේ මිලිමීටරවලිනි)

A ඊතලය දෙසින් පෙනෙන ඉදිරි පෙනුම
B ඊතලය දෙසින් පෙනෙන පැති පෙනුම
C ඊතලය දෙසින් පෙනෙන සැලැස්ම



(ii) ඔබ කැමති මිනුම් ගෙන විෂම පාද ත්‍රිකෝණයක් ඇඳ එහි පරිවෘත්තය නිර්මාණය කරන්න. ඔබ යොදාගත් මිනුම් ඒ ඒ පාදයට අදාළව සටහන් කරන්න.

01. **(i)**



C- සැලැස්ම



B- පැති පෙනුම



A- ඉදිරි පෙනුම

(ii)



01. (i) ලකුණු ලබා දීම

- ඉදිරි පෙනුම

1.	වක්‍ර රේඛාව	ලකුණු 01
2.	මධ්‍ය ලක්ෂය	ලකුණු 01
3.	ආනත රේඛාව	ලකුණු 01
4.	වමේ	ලකුණු 01
		ලකුණු 04

- පැති පෙනුම

1.	සැඟි රේඛාව	ලකුණු 01
2.	මැද තිරස් රේඛාව	ලකුණු 01
3.	වටේ	ලකුණු 01
		03

- සැලැස්ම ඇඳීම

1.	සැඟි රේඛාව	ලකුණු 02
2.	මැද තිරස් රේඛාව	ලකුණු 02
3.	මැද සිරස් රේඛාව	ලකුණු 01
		05

- වෙනත්

1.	දිග, පළල,උස දැක්වෙන් ලෙස මිනුම් 03 ට	ලකුණු 01
2.	තෙවන කෝණ ක්‍රමයට	ලකුණු 01
3.	අවම වශයෙන් නම් කිරීම් 02 කට	ලකුණු 01
		03

මුළු ලකුණු 15

01. (ii) ලකුණු ලබා දීම

ත්‍රිකෝණ නිර්මාණය ලකුණු 02 යි.

මිනුම් තුනම ලකුණු කිරීමට ලකුනු 01 බැගින් ලකුණු 03 යි

ලකුණු 05 යි

- පළමු වන ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 20 කි.

2. පාසල සතු ඔසු උයන සඳහා එළිමහන් උද්‍යාන බංකුවක් සෑදීමට තීරණය වී ඇත. මේ සඳහා අනුමත වූ සැලසුම් රූපසටහනේ දැක්වේ.



බංකුව සෑදීම සඳහා භාවිත කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය, ආවුද හා උපකරණ පාසල් තාක්ෂණ ඒකකය සතුව ඇත. එනම්,

- ඝනකම 25 mm දිග 1200 mm, පළල 100 mm වූ ලෑලි
- 25 mm × 50 mm හරස්කඩ සහිත දිග 1230 mm, දිග 630 mm, දිග 460 mm, දිග 430 mm වූ සෘජුකෝණාස්‍රාකාර මෘදු වානේ කුහර පයිප්ප (Box Bar)
- ස්වයංව පොට කැපෙන දිග 30 mm ස්කුරුප්පු ඇණ
- කැපීම, විදීම, සවි කිරීම සඳහා අවශ්‍ය ආවුද හා උපකරණ
- විද්‍යුත් චාප වෙල්ඩින් උපකරණ හා ආම්පන්න
- නිමහම් කිරීමේ ද්‍රව්‍ය, ආලේප, පින්සල් ආදිය

(i) මෙම බංකුව තැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය ඒ ඒ කාර්යන්ට භාවිත කරන උපකරණ/ආවුද ආදිය සඳහන් කරමින් පියවර ආකාරයෙන් විස්තර කරන්න.

(ii) මෙම බංකුවේ කල්පැවැත්ම සඳහා අනුගමනය කළ හැකි නිමහම් කාර්යන් සඳහන් කරන්න.

(iii) බංකුව සඳහා දී ඇති සැලසුම, වඩා ශක්තිමත් කිරීමට ඔබ යෝජනා කරන/නිර්මාණය කරන අමතර ලෝහ නළ සම්බන්ධතා රූපසටහන් මගින් දක්වන්න.

(i)

- කොටස් ලකුණු කර ගැනීම - මිනුම් පටිය, වානේ කෝදුව අඳින කටුව
- කොටස් වෙන් කර ගැනීම - ලෝහ කපන කියත, ග්‍රයින්ඩරය, අත් කියත
- කොටස් සම්බන්ධ කිරීම - විදුලි චාප වෑල්ඩිං උපකරණ,වායු පෑස්සීම
- සිදුරු විද ගැනීම - අත් විදුම් යන්ත්‍රය, විදුලි විදුම් යන්ත්‍රය
- ලී පටි සවි කිරීම - ඉන් පැක්ට් ඩ්‍රිල් - ස්කුරුප්පු නියන හෝ අදාල ආවුද
- සුමට කිරීම, නිමාව - ඇමරි කඩදාසි, ග්‍රයින්ඩරය, එනමල් තීන්ත (Enamal P aint) , බුරුසු

ඉහත සඳහන් පියවර අනුව විස්තර ඉදිරි කිරීම - ලකුණු 03 යි
පියවර 03 ක් හෝ 04 ක් ඉදිරි පත් කිරීම - ලකුණු 01 යි.
පියවර 01 ක් හෝ 02 ක් ඉදිරිපත් කිරීම - ලකුණු 01 යි.

(ii)

- දැව කොටස් - සුමට කර දැව ආලේප ගැල්වීම, සීලර් ආලේප හෝ වෝටර් බේස් (Water Base) කිරීම ගැලපෙන ආදාළ වර්ණ තීන්ත ආලේප කිරීම, ස්ප්‍රේ කිරීම
- ලෝහ කොටස් - මල නිවාරණ තීන්ත දෙවරක් හා ඇනමල් (Enamal) තීන්ත දෙවරක් ආලේප කිරීම හෝ "ස්ප්‍රේ" කිරීම
  ඉහත පරිදි දැව හා ලෝහ කොටස් වෙන් වශයෙන් තීන්ත ආලේප කිරීම/ වෝටර් බේස් ගැල්වීම දක්වා තිබීම.

(ලකුණු 03 යි)

- පොදුවේ දැව ලෝහ සඳහා ආරක්ෂක ආලේප ගැල්වීම සඳහන් කිරීම.

(ලකුණු 02 යි)

(iii)



අමතර කකුල් යෙදීම



අමතර වැර ගැන්වීම සම්බන්ධතා යෙදීම



පාද යා වන සේ අමතර "බොක්ස් බාර්" එකක් යෙදීම

✶ හෝ වෙනත් සුදුසු නිර්මාණයක්

නිර්මාණ 03 ක් හෝ 02 ක් රූප මගින් ඉදිරිපත් කිරීම - මුළු ලකුණු

(ලකුණු 04 යි)

නිර්මාණ 01 ක් රූප මගින් ඉදිරිපත් කිරීම

(ලකුණු 02 යි)

(02 වන පිළිතුරට මුළු ලකුණු 10 යි)

3. යතුරුපැදියක විදුලි අවශ්‍යතා සඳහා බැටරියකින් හා මැග්නිටෝවෙන් විදුලිය ලබාගනු ලැබේ.

(i) යතුරුපැදි සංඥා පහන් පරිපථයක රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න.

(ii) යතුරුපැදියක විදුලි පහන් දැවියාමට හේතුවිය හැකි කරුණු **හතරක්** සඳහන් කරන්න.

(iii) 6 V ඊයම් අම්ල බැටරියක (තෙත් බැටරියක) අභ්‍යන්තරය සකස් වී ඇති ආකාරය රූපසටහන් සහිතව විස්තර කරන්න.

(i)



(නිවැරදි පරිපථ සටහනට - ලකුණු03)

(ii)

- බැටරිය විසන්ධි වී තිබීම
- බැටරිය උපරිම ලෙස විසර්ජනය වීම
- R R යුනිට් දැවී තිබීම
- භූගත අග්‍රය විසන්ධි වී තිබීම
- බල්බයේ ආයු කාලය අවසන් වී තිබීම
- බල්බයේ විභව අන්තරය යතුරු පැදියේ ස්ථාපිත විභව අන්තරයට වඩා අඩු වීම.

(කරුණු 03 ක් හෝ 04 ක් ලියා දැක්වීමට - ලකුණු 03 යි
කරුණු 02 ක් ලියා දැක්වීමට - ලකුණු 02 යි.
කරුණු 01 ක් ලියා දැක්වීම - ලකුණු 01 යි)

(iii)



- එක් කෝෂයක වොල්ටීයතාවය 2 V කි.
- කෝෂ 03 ක් පිළිවෙලින් ශ්‍රේණිගතව සම්බන්ධ කර ඇත.
- ඊයම් අම්ල බැටරියක රසායනික ද්‍රව්‍ය ලෙස යොදෙනු ලබන්නේ සල්ෆියුරික් අම්ලයට ආසෘත ජලය එකතු කිරීමෙනි.

(නිවැරදි රූප සටහන කෝෂ 03 ඇඳ + හා - තහඩු නම් කර වොල්ටීයතා අගයන් නම් කර ඇත්නම් , ලකුණු 02 කි)
(ඒවා නිවැරදිව විස්තර කර ඇත්නම් ලකුණු 02 කි.)
(මුළු ලකුණු 04)

4. ආරක්ෂක පූර්වෝපායන් යනු තාක්ෂණික ක්‍රියාකාරකම් සිදු කිරීමට පෙර සිදු කරනු ලබන පෙර සූදානම් ය.

(i) ආරක්ෂක පූර්වෝපායන් අනුව ක්‍රමානුකූලව වැඩබිමක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සාධක **හතරක්** ලියා දක්වන්න.

(ii) කර්මාන්තශාලාවක ප්‍රමාණවත් ඉඩකඩ තිබීමේ වාසි **තුනක්** සඳහන් කරන්න.

(iii) වැඩබිමක අනතුරු සංඥාවක් නිකුත් කිරීමේ දී එම සංඥාවේ අඩංගු විය යුතු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(i)

- මානසික ඒකාග්‍රතාවය
- ආකර්ශනීය වැඩ බිම
- මානව සම්පත් කළමණාකරනය
- කාර්මිකයන්ගේ පවිත්‍රතාවය
- යහපත් කාර්මික විනය
- ආවුද උපකරණවල පවිත්‍රතාවය
- ප්‍රමාණවත් ඉඩකඩ
- ආලෝකය හා වාතාශ්‍රය ලැබීම ආදිය

(එක් පිළිතුරුකට ලකුණු 01 බැගින් පිළිතුරු 04 කට මුළු ලකුණු 04 යි)

(ii)

- අලුත් වැඩියා කල යුතු අමතර කොටස් අස්ථාන ගත නොවීම
- ආවුද උපකරණ අස්ථාන ගත නොවීම
- කාර්මිකයන් අතර ප්‍රශ්න ඇති නොවීම
- කර්මාන්ත ශාලාව තුළ පිළිවෙල හා ක්‍රමාණුකූල බව තිබීම
- කාර්මිකයින්ට වැඩ කිරීමේ පහසුව

(එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 03)

(iii)

- පැහැදිලි බවත් තිබීම
- නිවැරදි බව
- පහසුවෙන් හඳුනා ගත හැකි වීම
- අන් ශබ්දවලට වඩා වැඩි ශබ්දයක් නැඟිය යුතු වීම
- සියලු දෙනාගේම අවධානය පහසුවෙන් ලබා ගත හැකි වීම

(අවම වශයෙන් පිළිතුරු 03 ක් සපයා ඇත්නම් ලකුණු 01 බැගින් 1 X 3 = 03)

(මුළු ලකුණු 10 යි)

5. මිනිසාගේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා තුනී ලෝහ තහඩු භාවිතයෙන් ලැබෙන පිටිවහල සැලකිල්ලට ගත යුතු කරුණකි.

(i) තුනී ලෝහ තහඩුවලින් භාණ්ඩ නිෂ්පාදනය ව්‍යාප්ත වීමට බලපාන කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ii) තුනී ලෝහ තහඩු භාවිත කර සිදු කරන නිෂ්පාදන කර්මාන්ත **හතරක්** උදාහරණ සහිතව ලියා දක්වන්න.

(iii) තුනී ලෝහ තහඩු, භාවිත ලෝහ අනුව බෙදා වෙන් කළ හැකි කාණ්ඩ **හතර** උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න.

(i)

- නිෂ්පාදන වියදම අවම කර ගැනීම
- සැහැල්ලු බව හා සවි ශක්තිය
- නිමහම් කිරීමේ පහසුව
- කල්පැවැත්ම
- ගබඩා කිරීමේ හා ප්‍රවාහනයේ පහසුව
- කොටස් සම්බන්ධ කිරීමේ පහසුව
- අලංකාරවත් නිමාවක් ලබා ගැනීමට හැකිවීම ආදිය

✶ කරුණු හතරක් සඳහන් කිරීම
(ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(ii)

- ගොඩ නැගිලි කර්මාන්තය - වැහිපීලි
දොර ජනෙල්
සිවිලිම් හා සෙවිලි තහඩු
තාච්චි නිෂ්පාදනයට
- වාහන කර්මාන්තය - වාහන බඳවල් හා අලංකරණ උපාංග නිර්මාණය
- කෘෂි කර්මාන්ත වැඩ කටයුතුවලදී - බාල්දිය, ටැංකි
තාච්චි, බේසම් හා
වෙනත් ඇසුරුම් නිෂ්පාදනයට
- මුළු තැන්ගෙයි උපකරණ නිෂ්පාදනයේදී - බේසම්
ආහාර ඇසුරුම්
පිසින බඳුන්
පිඟන් කෝප්ප නිෂ්පාදනය
- ගෘහ හා කාර්යාලීය උපකරණ නිෂ්පාදනයේ - වානේ අල්මාරි
කබඩ් පුටු
ලිපිගොනු කබඩ්
සේප්පු නිෂ්පාදනයට

(භාවිතා කරන කර්මාන්ත හා අවස්ථා 03 ක් දක්වා ඇත්නම් ලකුණු 01 යි. ඒවාට උදාහරණ දක්වා ඇත්නම් ලකුණු 02 යි. මුළු ලකුණු 03 කි.)

(iii)

- ෆෙරස් ලෝහ තහඩු - මෘදු වානේ
මලනොකන වානේ
- ආලේපිත තහඩු - ගැල්වනයිස් තහඩු
ටින් අලේපිත තහඩු
ටර්නි ප්ලේට්
ඇලුමිනියම් ප්ලේට්
- පිරිසිදු ලෝහ තහඩු - තඹ, තුත්තනාගම්, ඇලුමිනියම්, ටින්, ඊයම්
- මිශ්‍ර ලෝහ තහඩු - පිත්තල, ලෝකඩ

(කාණ්ඩ 04 ලියා ඇත්නම් ලකුණු 02 කි. අවම වශයෙන් උදාහරණ එක බැගින්වත් සඳහන් කර ඇත්නම් ලකුණු 01 කි. එම නිසා මුළු ලකුණු 03 කි.)

6. වාත්තු කිරීමෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම දීර්ඝ ඉතිහාසයක් ඇති කර්මාන්තයකි.

(i) වාත්තු කිරීමෙන් ලෝහ භාණ්ඩ නිපදවීමේ දී යොදාගන්නා තෙත් වැලි වාත්තු කිරීමේ ක්‍රමය විස්තර කරන්න.

(ii) වාත්තු කිරීම මගින් භාණ්ඩ නිපදවීමෙන් ලැබෙන වාසි **හතරක්** ලියා දක්වන්න.

(iii) වාත්තු කිරීමෙන් නිපදවන භාණ්ඩ නිමහම් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර එම නිමහම් කිරීමේ ක්‍රියාවලියේ **හතර** ආකාර කවරේදැයි පැහැදිලි කරන්න.

(i) තෙත වැලි ක්‍රමයේදී වාත්තු පෙට්ටි (අරු පෙට්ටිය) තුලට යොදන පස් යාන්තමින් තෙත් කොට තද කර බඳන ද්‍රව්‍යකින් යොදනු ලබයි. එමනිසා වැලි කඩා නොවැටේ. මෙම ක්‍රමයේදී නිෂ්පාදනවල තරමක් රළු බව වැඩිය.

(සුදුසු පරිදි විස්තර කර ඇත්නම් ලකුණු 03 යි)

(වැලි තෙත් කොට යන්න ලියා තිබීම අනිවාර්ය වේ.)

(ii)

- මහා පරිමාණයේ කර්මාන්ත සඳහා
- එකම ආකාරයේ භාණ්ඩ නිපදවිය හැකි වීම
- අතින් නිම කළ නොහැකි භාණ්ඩ නිෂ්පාදන කළ හැකි වීම
- නෂ්පාදන වියදම අඩු වීම
- අමු ද්‍රව්‍ය අපතේ යාම වැලකීම

(ලකුණු 01 බැගින් 1 x 3 = ලකුණු 03 යි)

(iii)

- නිෂ්පාදනයේ වැලි ඉවත් කිරීම
  කම්බි බුරුසුවකින් හෝ නියිලෝන් බුරුසුවක් මගින් නිෂිපාදනයේ වැලි ඉවත් කිරීම
- වෙනත් අපද්‍රව්‍ය ඉවත් කිරීම
- කඩතොලු වූ කොටස් පිරවීම
  නිර්මාණයේ කඩතොලු ඇත්නම් එම ලෝහයම භාවිත කර ලෝහ පිරවුමක් සිදු කල යුතුය.
- සුමට කිරීම
  සිදු රු කිරීමට ඇත්නම් ඩ්‍රිල් (Dril) /මිලින් මැෂින් භාවිතා කර සිදුරු සැකසීම අනතුව පෘෂ්ඨය මතුපිට ලියවන පට්ටල් ආධාරයෙන් පොලිෂ් කිරීම.

(ක්‍රියාවලි 04 ක් ලියා ඇත්නම් ලකුණු 02 කි.

ක්‍රියාවලි 04 ක් විස්තර කර ඇත් නම් ලකුණු 02 කි)

මුළු ලකුණු 04 යි

7. ජල සිසිලන ක්‍රමය සහිත එන්ජින්වල උපරිම බලය නිපදවීම සඳහා සිසිලන ක්‍රමය මගින් ප්‍රබල බලපෑම් ඇති කරයි.
   (i) ජල සිසිලන ක්‍රමයේ භාවිත කරන සොඬ නළ නිපදවා ඇති ක්‍රමය විස්තර කරන්න.
   (ii) ජල සිසිලන ක්‍රමයේ දෝෂ නිසා එන්ජිම ක්‍රියාකාරී උෂ්ණත්වයට පත්වීම ප්‍රමාද වීමෙන් ඇතිවන අවාසිදායක තත්ත්වයන් **තුනක්** සඳහන් කරන්න.
   (iii) ජල සිසිලන ක්‍රමයේ විකිරකයේ යොදා ඇති පීඩන පියනේ රික්ත වැල්වය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න.

(i) සොඬල නල නිපදවා ඇත්තේ කැන්වස්වලින් සදා ඇති සැකිල්ලකට රබර් වක්කිරීමෙනි.

(ඉහත පරිදි සුදුසු ලෙස විස්තර කර ඇත්නම් ලකුණු 03 කි.)

(ii)

- පන ගැන්වීමට වැඩි කාලයක් ගත වීම
- ඇරඹුම් මෝටරය දීර්ඝ කාලීනව ක්‍රියාකරවීම නිසා මෝටරයට සහ බැටරියට හානි සිදු විය හැක.
- තෙල් දහනය වැඩි වීම
- එන්ජිම කාර්යක්ෂමතාවය අඩුය.
- ශබ්දය වැඩි වේ.

(කරුණු 03 ක් ලියා දැක්වීමට ලකුණු 01 බැගින් ලකුණු 03 කි)

(iii) පීඩන පියනිකින් වැල්ව දෙකක් පවතී. ඉන් රික්ත වැල්වයෙන් සිදු කරන්නේ පද්ධතිය තුළ රික්තයක් ඇත වීම වැලැක්වීමයි. එන්ජිම ක්‍රියාකර නැවැත්වූ පසු එන්ජිහ සිසිල් වන විට ජල වාෂ්පී-සනීභවනය වී ජලයට එකතු වීම නිසා විකරකයේ ජල මට්ටමට ඉහලින් රික්තයක් ඇති වේ. එම රික්තය ඉවත් නොකළ හොත් වායු ගෝලීය පීඩනය නිසා විකිරකය හැකිලී යාම සිදු විය හැකිය. විකිරකය තුළ පීඩනය අඩු වූ විට රික්ත වැල්වය විවෘත වී පිටාර නලය තුළින් පිටාර ටැංකියේ ඇති ජලය විකිරකය තුලට ගපා එන නිසා එහි රික්තය ඉවත් කරයි.

සුදුසු පරිදි විස්තර කර ඇත්නම් ලකුණු 04 කි. (එන්ජිම සිසිල් අවස්ථාවේ රික්ත වැල්වය විවෘත වී පිටාර ටැංකියේ ජලය විකිරකය තුලට පැමිණිය යුතු බව අනිවාර්යයෙන් සඳහන් කළ යුතුව තිබේ.)

(අසම්පූර්ණ පිළිතුර ලියා ඇත්නම් ලකුණු 02 කි. සම්පූර්ණ පිලිතුර ලියා ඇත්නම් ලකුණු 04 කි)